2022 ජූලි 25
2022 யூலை 25
25th July 2022

NAOSL

# 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන විගණකාධිපති ත්‍රෛවාර්ෂික වාර්තාව

# 2018 இன் 19 ஆம் இலக்க தேசிய கணக்காய்வு அதிகாரச்சட்டத்தின் 14 ஆவது பிரிவின் பிரகாரம் பாராளுமன்றத்திற்கு சமர்ப்பிக்கப்படுகின்ற கணக்காய்வாளர் தலைமை அதிபதியின் மூன்றாண்டு அறிக்கை

# Triennial Report of the Auditor General presented in parliament in terms of Section 14 of the National Audit Act, No. 19 of 2018

එකොළොස් වන කාණ්ඩය - 02
பதினோராவது தொகுதி - 02
Eleventh Volume - 02

## විශ්ව විද්‍යාල, පශ්චාද් උපාධි ආයතන හා උසස් අධ්‍යාපන ආයතන

## பல்கலைக்கழகங்கள், பட்டப்பின் படிப்பு நிறுவனங்கள் மற்றும் உயர் கல்வி நிறுவனங்கள்

## Universities, Postgraduate Institutes and Higher Education Institutes


ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE




පටුන


| අංකය | විශ්ව විද්‍යාලයේ නම | පිටු අංකය |
|---|---|---|
| 01 | කොළඹ විශ්වවිද්‍යාලය | 3 |
| 02 | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 4-9 |
| 03 | මොරටුව විශ්වවිද්‍යාලය | 10 |
| 04 | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 11-12 |
| 05 | කැලණිය විශ්වවිද්‍යාලය | 13-14 |
| 06 | රුහුණු විශ්වවිද්‍යාලය | 15-18 |
| 07 | යාපනය විශ්වවිද්‍යාලය | 19-22 |
| 08 | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | 23 |
| 09 | ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | 24 |
| 10 | ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය | 25-27 |
| 11 | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 28-29 |
| 12 | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය | 30-33 |
| 13 | ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය | 34 |
| 14 | ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | 35-37 |
| 15 | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය | 38-39 |
| 16 | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 39 |
| 17 | ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 40-41 |
| 18 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 42-43 |
| 19 | ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද වෛද්‍ය විද්‍යායතනය | 44 |
| 20 | ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය | 45 |
| 21 | කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනය | 45-46 |
| 22 | ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය | 46 |
| 23 | මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය | 47 |
| 24 | ස්වාමි විපුලනාදන් සෞන්දර්ය අධ්‍යයන ආයතනය | 47-49 |
| 25 | කෘෂිකර්ම විද්‍යා පශ්චාද් උපාධි ආයතනය | 50 |
| 26 | වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 51 |
| 27 | පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය | 51 |
| 28 | කළමනාකරණය පශ්චාත් උපාධි ආයතනය | 52 |
| 29 | පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 53 |
| 30 | විද්‍යා පශ්චාද් උපාධි ආයතනය | 53-55 |
| 31 | ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය | 55-56 |
| 32 | මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාද් උපාධි ආයතනය | 57-58 |

**විශ්ව විද්‍යාල, පශ්චාද් උපාධි ආයතන හා උසස් අධ්‍යාපන ආයතන පිළිබඳ ත්‍රෛයි වාර්ෂික වාර්තාව - 2018 - 2020**

2018 දෙසැම්බර් 31 දිනෙන්, 2019 දෙසැම්බර් 31 දිනෙන් හා 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂ 03 සඳහා වූ විශ්ව විද්‍යාල 17 ක, උසස් අධ්‍යාපන ආයතන 10 ක හා පශ්චාද් උපාධි ආයතන 08 ක මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව, මාගේ විධානය යටතේ විගණනය කර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් වාර්තා ඒ ඒ වර්ෂවලදී පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව, පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ එම වාර්තාවල ඇතුළත් මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් අතරින් මානව සම්පත් අභිවර්ධන ආයතනය, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය හා මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනය යන උසස් අධ්‍යාපන ආයතන 03 හි තවදුරටත් අවධානය යොමුකළ යුතු අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් නොතිබුණු බැවින් එම ආයතන 03 හැරුනු කොට ඉතිරි ආයතන 32 හි තවදුරටත් අවධානය යොමු කළ යුතු අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් කරමින් මෙම ත්‍රෛයි වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරනු ලැබේ.

**ක්ෂේත්‍රය පිළිබඳ විශ්ලේෂණය**

1870 දී ලංකා වෛද්‍ය විද්‍යාලය (Ceylon Medical Collage ) ආරම්භකර තිබුණු අතර 1942 අංක 20 දරන ලංකා විශ්වවිද්‍යාල ආඥා පනත මගින් ලංකා වෛද්‍ය විද්‍යාලය හා ලංකා විශ්වවිද්‍යාල කොලීජිය ඒකාබද්ධ කර 1942 දී ලංකා විශ්වවිද්‍යාලය පිහිටුවා තිබුණි. ඉන් අනතුරුව 1972 අංක 1 දරන ලංකා විශ්වවිද්‍යාල පනත හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යන පනත් මගින් කොළඹ, පේරාදෙනිය, ශ්‍රී ජයවර්ධනපුර, කැළණිය, මොරටුව හා යාපනය යන විශ්වවිද්‍යාල ස්ථාපිත කර තිබුණි. මෙම වාර්තාවේ දිනය දක්වා වූ පසුගිය වර්ෂ 70 ක් තුළදී ප්‍රධාන වශයෙන් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතින් හා විශේෂිත පනත් කිහිපයක් මගින් විශ්ව විද්‍යාල 17 ක්, උසස් අධ්‍යාපන ආයතන 10 ක් හා පශ්චාද් උපාධි ආයතන 08 ක් දිවයින තුළ ස්ථාපිත කරමින් උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීමට ඒ ඒ අවධිවල රජයන් කටයුතු කර තිබුණි. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා පනත මගින් 1978 වර්ෂයේදී ස්ථාපිත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මෙම සියළු ආයතන නියාමනය කරනු ලැබේ.

2018, 2019 හා 2020 යන වර්ෂ 03 ට අදාළ දත්ත විශ්ලේෂණය කිරීමේදී, ඉහතින් විස්තර සඳහන් විශ්ව විද්‍යාල 17 හි වර්ෂ 03 හි මුළු වියදම රු.මිලියන 167,634.52 ක්වූ අතර ඉන් සියයට 82 ක් හෙවත් රු.මිලියන 137,855.98 ක්ම රාජ්‍ය ප්‍රදාන මගින් ආවරණය කර තිබුණි. කෙසේ වුවද, ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය හැරුණු කොට ඉතිරි විශ්වවිද්‍යාල 16 විසින් 2020 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 14,327.48 ක් දිගුකාලීනව ආයෝජනය කර තිබුණි. ඒ අනුව එම විශ්වවිද්‍යාල 16 හි නඩත්තුව සඳහා රජය වැයකරන මුදල රු.මිලියන 14,327.48 කින් අඩුකරගත හැකිව තිබුණු බව නිරීක්ෂණය විය.

එසේම උසස් අධ්‍යාපන ආයතන 10 හි වර්ෂ 03 හි මුළු වියදම රු.මිලියන 17,762.54 ක්වූ අතර ඉන් සියයට 77 ක් හෙවත් රු.මිලියන 13,705.50 ක්ම රාජ්‍ය ප්‍රදාන මගින් ආවරණය කර තිබුණි. කෙසේ වුවද, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය හැරුණු කොට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඇතුළු ඉතිරි උසස් අධ්‍යාපන ආයතන 09 ක් විසින් 2020 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 687.35 ක් දිගුකාලීනව ආයෝජනය කර තිබුණි. ඒ අනුව එම උසස් අධ්‍යාපන ආයතන 09 හි නඩත්තුව සඳහා රජය වැයකරන මුදල රු.මිලියන 687.35 කින් අඩුකරගත හැකිව තිබුණු බව නිරීක්ෂණය විය.

තවද, පශ්චාද් උපාධි ආයතන 08 හි වර්ෂ 03 හි මුළු වියදම රු.මිලියන 3,937.4 ක්වූ අතර ඉන් සියයට 31 ක් හෙවත් රු.මිලියන 1,242.10 ක්ම රාජ්‍ය ප්‍රදාන මගින් ආවරණය කර තිබුණි. කෙසේ වුවද, ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය හැරුණු කොට ඉතිරි පශ්චාද් උපාධි ආයතන 07 විසින් 2020 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 2,040.10 ක් දිගුකාලීනව ආයෝජනය කර තිබුණි. ඒ අනුව එම පශ්චාත් උපාධි ආයතනය 07 හි නඩත්තුව සඳහා රජය වැයකරන මුදල රු.මිලියන 2,040.10 කින් අඩුකරගත හැකිව තිබුණු බව නිරීක්ෂණය විය.

අරමුදල් උපයෝජනය නොකිරීම, බැඳුම්කර කඩකිරීම් පිළිබඳව ක්‍රියාමාර්ග ගෙන නොතිබීම, අධ්‍යයන කාර්යමණ්ඩලය පැමිණීම හා පිටවීම ඇඟිලි සළකුණු සටහන් යන්ත්‍රවල සටහන් නොකිරීම, ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම යන නිරීක්ෂණ ක්ෂේත්‍රයට අදාළ පොදු නිරීක්ෂණයන් වන බවද වැඩිදුරටත් නිරීක්ෂණය විය.

**1. කොළඹ විශ්වවිද්‍යාලය**

**--------------------------**

| **වර්ෂය** | **2018** | **2019** | **2020** |
|---|---|---|---|
| **විගණන මතය** | **තත්වාගණනය කළ මතය** | **තත්වාගණනය කළ මතය** | **තත්වාගණනය කළ මතය** |

| **විගණන නිරීක්ෂණය/ඌනතාවය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **අස්ථිත්වයේ අදහස් දැක්වීම හා ගනු ලැබූ වැළැක්වීමේ පියවර** | **වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|
| පශ්චාත් උපාධිය සම්පූර්ණ කිරීම සඳහා වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා තිබුණු ආචාර්යවරු 18 දෙනෙකු අදාළ සුදුසුකම් සම්පූර්ණ කර නොමැතිව නැවත සේවයට වාර්තා කර තිබීම හේතුවෙන් අයවිය යුතු බැඳුම්කර වටිනාකම රු.78,241,772 ක් හා නැවත සේවයට වාර්තා කර නොතිබුණු ආචාර්යවරු 12 දෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 02 සිට වර්ෂ 18 දක්වා පැරණි එකතුව රු.20,212,040 ක් 2020 දෙසැම්බර් 31 දින දක්වාම අයකර ගැනීමට කළමනාකරණය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ගිවිසුම්ගත පරිදි අදාළ වටිනාකම් අය කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | විදේශ ගතවී නැවත සේවයට වාර්තා නොකළ ආචාර්යවරුන්ට අදාළ අය විය යුතු වටිනාකම් අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව. | අධ්‍යයන නිවාඩු ලබා විදේශගතවීමේදී එකඟ වූ බැඳුම්කර කඩ කිරීම හේතුවෙන් 2021 සැප්තැම්බර් 30 දින වන විට නිලධාරීන් 20 දෙනෙකුගෙන් අයවිය යුතු රු.53,791,505 ක් අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. |

## 2. පේරාදෙණිය විශ්වවිද්‍යාලය

| වර්ෂය | 2018 | 2019 | 2020 |
| --- | --- | --- | --- |
| විගණන මතය | තත්වාගණනය කළ මතය | තත්වාගණනය කළ මතය | තත්වාගණනය කළ මතය |

| | විගණන නිරීක්ෂණ/ ඌනතාවය | විගණකාධිපතිගේ නිර්දේශය | අස්ථිත්වයේ අදහස් දැක්වීම හා ගනු ලැබූ වැළැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
| --- | --- | --- | --- | --- |
| (අ) | පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අයත් ගැටඹේ පිහිටි පර්චස් 40 ක පමණ ඉඩම 1987 දෙසැම්බර් 31 දින සිට 2017 දෙසැම්බර් 30 දින දක්වා වසර 30 ක බදු පදනම මත දිවිනැගුම දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබුණු අතර ඒ සඳහා 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.7,200,000 ක හිඟ බදු මුදල හා 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ලැබිය යුතු බදු මුදල් ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | අයවිය යුතු ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2022 ජනවාරි 31 දින වන විටත් නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. |
| (ආ) | අනුමැතියකින් තොරව පශු වෛද්‍ය පීඨයේ ලිපිනය යටතේ බාහිර පාර්ශවයන් විසින් පීඨයේ පශු වෛද්‍ය රෝහල සංවර්ධනය කිරීම වෙනුවෙන් ලෙස සඳහන් කරමින් 2014 ජූනි 06 දින රාජ්‍ය බැංකු ශාඛාවක ඉතිරි කිරීමේ ගිණුමක් ආරම්භ කර 2019 ජූනි 04 දින වන විට රු.2,606,324 ක මුදලක් රැස්කර තිබුණු අතර ඉන් රු.2,065,613 ක මුදලක් ආපසු ලබා ගෙන තිබුණි. පීඨයේ ඔසුසල බාහිර පාර්ශවයන් වෙත ලබාදීමෙන් මාසයකට රු.15,000 ක මුදලක් අවිධිමත් ලෙස ලබාගෙන තිබුණද ඉතිරි මුදල් ලැබීම් ප්‍රභවයන් හා වියදම් කිරීම්වලට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | මෙවැනි තත්ත්වයන් නැවත ඇතිවීම වැළැක්වීමට අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රමය වැඩි දියුණු කිරීම හා විමර්ශන වාර්තාවට අනුව කඩිනමින් පියවර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. | මේ සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් විනය පරීක්ෂණය අවසන් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | බැදුම්කර සහ ගිවිසුම කඩ කරන ලද ආචාර්යවරුන් 102 දෙනෙකුගෙන් රු.140,780,356 ක මුදලක් අයවීමට තිබුණි. මේ නිලධාරීන් බැදුම්කර සහ ගිවිසුම් කඩ කර වර්ෂ 01 සිට වසර 50 දක්වා කාලයක් ගතවී ඇතත්, එම ශේෂ අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් විශ්වවිද්‍යාලය විසින් අනුගමනය කර නොතිබුණි. | බැදුම්කර සහ ගිවිසුම් කඩ කරන ලද නිලධාරීන්ගෙන් අයවිය යුතු මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. | බැදුම්කර සහ ගිවිසුම් කඩ කරන ලද ආචාර්යවරුන්ගෙන් අයවිය යුතු මුදල් කඩිනමින් අය කර ගැනීමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබාදුන් බව. | 2022 ජනවාරි 31 දින වන විටත් රු.131,871,454 ක් අයකර ගෙන නොතිබුණි. |
| (ඈ) | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ලැබිය යුතු රු.400,000 ක රක්ෂණ වන්දි මුදලක් වර්ෂ 08 කට අධික කාලයක් ගතවී තිබුණත්, අයකර ගෙන නොතිබුණි. | ලැබිය යුතු මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. | පාලක සභා නිර්දේශය ලැබුනු පසු අවශ්‍ය කටයුතු සිදුකිරීමට නියමිත බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මුදල් අයකර ගෙන නොතිබුණි. |
| (ඉ) | 2013 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුළ වැටුප් නතර කර ඇති නිලධාරීන් 13 දෙනකුගෙන් අයවිය යුතු රු.1,355,275 ක ණය ශේෂයක් 2020 වර්ෂය අවසානය වන තෙක්ම අය කර නොතිබුණි. | ලැබිය යුතු මුදල් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. | කිසියම් සේවකයෙකු වැටුප් රහිත නිවාඩු හෝ සප්ත වාර්ෂික නිවාඩු ලබා ගන්නා විට නිවාඩු ප්‍රදානය කිරීමට පෙර ඔවුන් විසින් ගෙවිය යුතු ණය ශේෂ පියවීමෙන් පසුව ඔවුන් වෙත නිවාඩු ලබා දීමට කටයුතු කරන ලෙස දන්වා ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් ණය මුදල අයකර ගෙන නොතිබුණි. |
| (ඊ) | ජයතිලක නේවාසිකාගාරය අළුත්වැඩියා කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුවට අදාළව ඉංජිනේරු ඇස්තමේන්තුව සහ කොන්ත්‍රාත්කරුගේ ඇස්තමේන්තුව අතර අයිතම 52 ක් සම්බන්ධයෙන් සියයට 30 සිට සියයට 577 දක්වා විචලනයක් හෙවත් ඉංජිනේරු ඇස්තමේන්තුව ඉක්මවා රු.8,217,408 ක මිල ගණන් ඉදිරිපත් කර තිබුණද, 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.2 (ක) මාර්ගෝපදේශය අනුව තාක්ෂණික ඇගයීම් කමිටුව ඒ පිළිබඳ සළකා බැලීමකින් තොරව 2017 නොවැම්බර් 06 දින කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගත වී තිබුණි. සංචලන අත්තිකාරම් වශයෙන් රු.14,039,397 ක් ගෙවා තිබුණු අතර කාලය දීර්ඝ කිරීමෙන් පසු 2019 දෙසැම්බර් 31 දින වන විට අළුත්වැඩියා කටයුතු නිම කළ යුතු වුවත්, 2020 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන්ට අනුකූලව කටයුතු කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විට වැඩ නිමකර තිබුණු නමුත් අයිතම 52 ක් සම්බන්ධයෙන් සියයට 30 සිට සියයට 577 දක්වා මිල විචලනයන් පිළිබඳව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සලකා බලා නොතිබීම පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | දෙසැම්බර් 31 දින දක්වාම වැඩ නිම කර නොතිබුණු අතර රු.2,135,946 ක් වූ කාර්යසාධන ඇපකරය දීර්ඝ කිරීමටද කටයුතු කර නොතිබුණි. | | | |
| (උ) | වෛද්‍ය පීඨයේ පශ්චාත් වෛද්‍ය විද්‍යා පාසල ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා 2014 සහ 2015 වර්ෂයන්හිදී රු.මිලියන 330 ක මුදලක් ප්‍රතිපාදන සලසා ගෙන ඉන් රු.39,703,080 ක් උපදේශන සේවා සමාගමකට ගෙවීම් කර තිබුණු නමුත් 2018 වර්ෂය අවසන් වන විටත් ඉදිකිරීම් සිදු කර නොතිබුණි. | නිසි ඇගයීමකින් පසු ව්‍යාපෘති ආරම්භ කළ යුතු අතර වාර්ෂික විසර්ජන පනතට අනුගත විය යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2022 ජනවාරි 31 දින වන විටත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඌ) | 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළ ඇස්තමේන්තුගත වටිනාකම රු.68,270,171 ක්වූ පුනරුත්ථාපන ව්‍යාපෘති 37 කට අදාළව මූලික කටයුතු සිදුකර කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්වලට එළඹ හෝ කොන්ත්‍රාත්කරු වෙත ප්‍රදාන ලිපි (Awarding Letters) ලබාදී තිබියදී ක්‍රියාත්මක නොකර අතහැර දමා තිබුණි. | සැලසුම් සහිතව කර්මාන්තය ආරම්භ කර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. | සැලසුම් සහිතව කර්මාන්ත ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් අත්හැර දමන ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණු අතර කාර්යසාධන බැඳුම්කර මුදල් කර ගෙනද නොතිබුණි. |
| (එ) | 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ඉංජිනේරු පීඨයේ පශ්චාත් උපාධි පාඨමාලා 07 ක් සඳහා සිසුන් 628 දෙනෙකු බඳවාගෙන ඒ සඳහා රු.166,550,000 ක පාඨමාලා ගාස්තුවක් අයකර තිබුණද, එම පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | පශ්චාත් උපාධි පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතුය. | අනුමැතිය ලබාගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් එම පාඨමාලා සඳහා අනුමැතිය ලබා ගැනීමට අපොහොසත්වී තිබුණි. |
| (ඒ) | විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය යටතේ ක්‍රියාත්මක වන ඉංජිනේරු නිර්මාණ මධ්‍යස්ථානය මගින් පසුගිය වර්ෂ 03 තුළ බාහිර පාර්ශවයන් 07 ක් වෙත ඉදිකිරීම් සම්බන්ධව උපදේශන සේවාවන් ලබාදී ඇතත්, විශ්වවිද්‍යාල ඉදිකිරීම් ව්‍යාපෘති 11 ක් සඳහා උපදේශන සේවාවන් බාහිර පාර්ශවයන්ගෙන් ලබාගෙන ඒ සඳහා රු.93,829,364 ක් ගෙවා තිබුණි. | විශ්වවිද්‍යාලයේ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ඉංජිනේරු නිර්මාණ මධ්‍යස්ථානයෙන් උපදේශන සේවා ලබා ගැනීමට විධිමත් ක්‍රමවේදයන් හඳුන්වාදීමට කටයුතු කළ යුතුය. | මේ සඳහා ඉංජිනේරු නිර්මාණ මධ්‍යස්ථානයේ උපදෙස් ගැනීමට තීරණය කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මේ සඳහා විධිමත් ක්‍රමවේදයන් හඳුන්වාදීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඔ) | විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යය මණ්ඩලයේ ආචාර ධර්ම හා අධ්‍යයන වගවීම පිළිබඳ මාර්ගෝපදේශයේ 05 වන වගන්තියට පටහැනිව විශ්වවිද්‍යාලයේ පශු වෛද්‍ය පීඨයේ හිටපු පීඨාධිපතිවරයෙකු විසින් තම දියණිය සඳහා M.Phi උපාධිය පිරිනැමීමේදී එහි පරීක්ෂණ කටයුතු හා විභාග කටයුතු ඔහු විසින් අධීක්ෂණය කර 2016 ජූලි 12 දින අදාළ උපාධිය පිරිනැමීමට කටයුතු කර තිබුණි. | අදාළ මාර්ගෝපදේශය අනුව කටයුතු කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සැකසීම හා මෙම සිද්ධියට අදාළ ඉදිරි පියවර කඩිනමින් ගැනීමට කටයුතු කළ යුතුය. | විනය පරීක්ෂණයට යොමු කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් විනය පරීක්ෂණය අවසන් කර නොතිබුණි. |
| (ඕ) | 2009/2010 අධ්‍යයන වර්ෂයේ සිට 2012/2013 අධ්‍යයන වර්ෂය දක්වා අධ්‍යයන වර්ෂ 4 වෙනුවෙන් කෘෂිකර්ම පීඨය සඳහා සිසුන් 224 ක් ලියාපදිංචිවී නොතිබුණු අතර, එය ලියාපදිංචි කළ හැකි සිසුන්ගෙන් සියයට 20 ක ප්‍රතිශතයක් විය. | විශ්වවිද්‍යාල පද්ධතිය තුළම විශ්වවිද්‍යාලවලට ඇතුළත් කළ හැකි ශිෂ්‍ය ධාරිතාවය උපරිම කිරීමට කටයුතු කළ යුතුය. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් යොමු කරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් ලියාපදිංචි කර ඇතුළත් කර ගන්නා අතර එම ප්‍රමාණය වැඩි කර එවන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මෙම තත්ත්වය නිවැරදි කර නොතිබුණු අතර 2014 සිට 2020 දක්වා වූ අධ්‍යන වර්ෂ 07 කදී සිසුන් 344 ක් ලියාපදිංචිවී නොතිබුණි. |
| (ක) | 2014 අප්‍රේල් 01 දින සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ Master Landscape Archeology උපාධි පාඨමාලාව ක්‍රියාත්මත කිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් FreieUniversitat Berlin අතර ගිවිසුමකට එළඹ තිබුණි. එම ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ලබාදීමට එකඟවී තිබුණු යූරෝ 33,400 ක ගනුදෙනුවලට අදාළ කිසිදු ලිඛිත සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර ගිවිසුම්ගත කාලපරිච්ඡේදය අවසන්වී වසර 04 ක කාලයක් ගතවී ඇතත් මේ දක්වාම උපාධි පාඨමාලාව ක්‍රියාත්මක කර නොතිබුණි. | පීඨ මඟින් සිදු කරනු ලබන ව්‍යාපෘති සම්බන්ධයෙන් විධිමත් පාලන ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය. | පීඨ මඟින් සිදු කරනු ලබන ව්‍යාපෘති සම්බන්ධයෙන් විධිමත් පාලන ක්‍රමවේදයක් හඳුන්වාදී ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් විධිමත් පාලන ක්‍රමවේදයක් හඳුන්වාදීමට, අදාළ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කිරීමට හා උපාධි පාඨමාලාව ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ග) | 2014 වර්ෂය අවසානයේදී රු.7,586,873 ක් වැය කර වැඩ අවසන් කරන ලද කලාගාරය කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වර්ෂ 06 කට වැඩි කාලයක් නිෂ්කාර්යව පවතින අතර 2020 ගොඩනැගිල්ල භාවිතයට ගත නොහැකි ලෙස ගරා වැටි සිවිලිමද කඩා වැටී තිබුණි. | ගොඩනැගිලි ඉදිකිරීමේදී විධිමත් ඇගැයීමක් සහිතව ප්‍රශස්ත උපයෝජනයක් කළ හැකි වන පරිදි වැඩ පිළිවෙලක් සකස් කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2022 ජනවාරි 31 දින වන විට ගොඩනැගිල්ල භාවිතයට ගත නොහැකි ලෙස ගරාවැටී තිබුණි. |
| (ඝ) | ජයතිලක නේවාසිකාගාරය අළුත්වැඩියා කිරීම සඳහා 2017 නොවැම්බර් 06 දින කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගත වී ඒ සඳහා රු.14,039,397 ක මුදලක් සංචලන අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණද අළුත්වැඩියාව සඳහා කොන්ත්‍රාත්කරු වෙත වැඩ බිම භාරදී තිබුණේ අත්තිකාරම් ගෙවා මාස 06 කට පසුව 2018 මැයි මස 03 වන දින දීය. | විශ්වවිද්‍යාලය තුළ සිදු කරනු ලබන සියලු ඉදිකිරීම් ප්‍රමාණවත් ඇගැයීමක් හා අධීක්ෂණයක් මඟින් පමණක් සිදු කළ යුතුය. | නිවැරදි ඇස්තමේන්තු අනුව ප්‍රමාණවත් ඇගයීමක් හා අධීක්ෂණයක් යටතේ කටයුතු කිරීම සඳහා උපදෙස් ලබාදී ඇත. | කොන්ත්‍රාත්කරු වෙත වැඩබිම භාරදීමට ඇති හැකියාව පිළිබඳව තහවුරු කර ගැනීමකින් තොරව සංචලන අත්තිකාරම් නිකුත් කළ වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඡ) | විජේවර්ධන නේවාසිකාගාරය අළුත්වැඩියා කිරීම සඳහා රු.මිලියන 240.51 කට 2018 අප්‍රේල් 18 දින කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගතවී 2018 මැයි මස සංචලන අත්තිකාරම් වශයෙන් රු.40,017,474 ක මුදලක් ගෙවා තිබුණද කොන්ත්‍රාත්කරු වෙත වැඩ බිම භාරදී තිබුණේ ගිවිසුම්ගත වී මාස 09 කට පසුව එනම් 2019 පෙබරවාරි 08 දිනදීය. | විශ්ව විද්‍යාලය තුළ සිදු කරනු ලබන සියලු ඉදිකිරීම් ප්රමාණවත් ඇගැයීමක් හා අධීක්ෂණයක් මඟින් පමණක් සිදු කළ යුතුය. | නිවැරදි ඇස්තමේන්තු අනුව ප්‍රමාණවත් ඇගයීමක් හා අධීක්ෂණයක් යටතේ කටයුතු කිරීම සඳහා උපදෙස් ලබාදී ඇත. | කොන්ත්‍රාත්කරු වෙත වැඩබිම භාරදීමට ඇති හැකියාව පිළිබඳව තහවුරු කර ගැනීමකින් තොරව සංචලන අත්තිකාරම් නිකුත් කළ වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ට) | අරුණාචලම් නේවාසිකාගාරයේ අළුත්වැඩියා කිරීම සඳහා 2018 ජනවාරි 08 දින රු. මිලියන 45.18 ට කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගත වී 2019 ජූලි මාසයේදී සංචලන අත්තිකාරම් වශයෙන් රු.7,102,351 ක මුදලක් ගෙවා වසරකට වැඩි කාලයක් ගතවී තිබුණද වැඩ ආරම්භ කිරීම සඳහා වැඩබිම කොන්ත්‍රාත්කරු වෙත භාරදී නොතිබුණි. | විශ්ව විද්‍යාලය තුළ සිදු කරනු ලබන සියලු ඉදිකිරීම් ප්‍රමාණවත් ඇගැයීමක් හා අධීක්ෂණයක් මඟින් සිදු කිරීමට කටයුතු කළ යුතුය. | නිවැරදි ඇස්තමේන්තු අනුව ප්‍රමාණවත් ඇගයීමක් හා අධීක්ෂණයක් යටතේ කටයුතු කිරීම සඳහා උපදෙස් ලබාදී ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් නේවාසිකාගාරයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. |
| (ඩ) | විශ්වවිද්‍යාලයේ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම වෙනුවෙන් 2015 දෙසැම්බර් 15 දින රු.3,500,000 ක මුදලකට බාහිර පාර්ශවයක් සමඟ ගිවිසුම්ගත වී ඉන් රු.740,000 ක් ගෙවා වසර 03 ක කාලයක් ගතවී ඇති නමුත් කාර්යය ඉටු කර ගැනීමට හෝ අදාළ මුදල ආපසු ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. | ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතුය. | කරන ලද කාර්යයයේ ප්‍රමාණාත්මක හා ගුණාත්මකභාවය පිළිබඳ විධිමත් අධ්‍යනයකින් තොරව ගෙවීම් කටයුතු සිදු නොකරන ලෙසත්, එකඟ වූ කාල රාමුවකට අනුව ආයතනයේ වැඩ කටයුතු සිදු කරගෙන යන බව නිරන්තරයෙන් තහවුරු කර ගන්නා ලෙසත් අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් කාර්යය ඉටු කර ගැනීමට හෝ අදාළ මුදල ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

**3.** **මොරටුව විශ්වවිද්‍යාලය**

| | | | |
|---|---|---|---|
| **වර්ෂය** | **2018** | **2019** | **2020** |
| **විගණන මතය** | **තත්වාගණනය කළ මතය** | **තත්වාගණනය නොකළ මතය** | **තත්වාගණනය නොකළ මතය** |

| | විගණන නිරීක්ෂණය/ඌනතාවය | විගණකාධිපතිගේ නිර්දේශය | අස්ථිත්වයේ අදහස් දැක්වීම හා ගනු ලැබූ වැළැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට එකතුව රු.2,675,341 ක් වූ ශිෂ්‍යත්ව අරමුදල් 16 ක් වර්ෂ 03 සිට වර්ෂ 10 ක් තුළ කිසිදු ශිෂ්‍යත්වයක් පිරිනැමීමකට උපයෝජනය කර නොතිබුණි. | අරමුදල් අදාළ අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් වැය කළ යුතුය. | මෙම ඌන උපයෝජිත ශිෂ්‍යත්ව අරමුදල් සම්බන්ධයෙන් විස්තරාත්මකව සොයා බැලීමට හා ඒවා ක්‍රියාකාරී තත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරන බව. | 2021 දෙසැම්බර් 31 දින වන විටත් මෙම අරමුදල් උපයෝජනය කර නොතිබුණි. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලීය පාඨමාලා හා දෙපාර්තමේන්තු සංවර්ධන අරමුදල් 34 ක එකතුව රු.13,921,449 ක් වර්ෂයක් තුළ අක්‍රියව පැවති අතර, අරමුදල් 21 ක එකතුව රු. 6,074,585 ක් වර්ෂ 4 ක කාලයක සිට උපයෝජනය කර නොතිබුණි. | අරමුදල් අදාළ අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් වැය කළ යුතුය. | 2020 වර්ෂයේ රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් විශ්වවිද්‍යාලය සම්පූර්ණයෙන්ම වසා තිබීමත්, අනෙකුත් මාස වලද, අධ්‍යනාංශ පූර්ණ ධාරිතාවයෙන් ක්‍රියාත්මක නොවීමත් හේතුවෙන් මෙම අරමුදල් 2020 වර්ෂයේ අක්‍රියව පැවති බව. | 2021 දෙසැම්බර් 31 දින වන විටත් මෙම අරමුදල් උපයෝජනය කර නොතිබුණි. |
| (ඇ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ xx පරිච්ඡේදයේ 3 (i) වගන්තිය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2017 ජූලි 10 දිනැති අංක 10/2017 දරන චක්‍රලේඛය අනුව සියලුම කාර්යමණ්ඩලය තම පැමිණීම් හා පිටවීම් ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සටහන් කළ යුතු වුවත් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමකින් තොරව 2020 වර්ෂය සඳහා රු.1,459,550,041 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. | අදාළ නීති රීති අනුව කටයුතු කළ යුතුය. | මුළු විශ්වවිද්‍යාල පද්ධතිය තුළම සිදුවන්නේ මෙම ක්‍රමවේදය වන බැවින් මොරටුව විශ්වවිද්‍යාලය තුළද එම ක්‍රමවේදය ක්‍රියාත්මක වන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. |

**4.** **ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

| | | | |
|---|---|---|---|
| **වර්ෂය** | **2018** | **2019** | **2020** |
| **විගණන මතය** | **තත්වාගණනය නොකළ මතය** | **තත්වාගණනය කළ මතය** | **තත්වාගණනය නොකළ මතය** |

| **විගණන නිරීක්ෂණය/ඌනතාවය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **අස්ථිත්වයේ අදහස් දැක්වීම හා ගනු ලැබූ වැළැක්වීමේ පියවර** | **වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|
| (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XX වෙනි පරිච්ඡේදයේ 3.1 වගන්තිය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2017 ජූලි 10 දිනැති අංක 10/2017 දරන චක්‍රලේඛය අනුව සියලුම කාර්යමණ්ඩලය තම පැමිණීම් හා පිටවීම් ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සටහන් කළ යුතු වුවත්, අධ්‍යයන සේවකයින්ගේ පැමිණීම, පිටවීම සටහන් කර නොතිබුණු අතරම පැමිණීම පිටවීම සනාථ කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතු බවට පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුවේදී උපදෙස් ලබාදී තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පොදු ව්‍යාපාර පිළිබඳ කමිටු උපදෙස් අනුව කටයුතු කළ යුතුය. | මෙය විශ්වවිද්‍යාල පද්ධතියට බලපාන කරුණක් වන බැවින් මේ සම්බන්ධයෙන් තීරණයක් ගෙන කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපදෙස් දිය යුතු බව හා මෙම කරුණ පෙර වර්ෂවලදීද පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුවේ සාකච්ඡාවට භාජනය වූ බව. | 2022 ජනවාරි 31 දින වන විටත් පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. |
| (ආ) වෛද්‍ය පීඨය සඳහා මෙත් සෙවන ඉඩමෙන් අක්කර 6.5 ක බිම් ප්‍රමාණයක් පවරා ගැනීම වෙනුවෙන් 1994 ජුනි 29 දින ගෙන තිබුණු අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි 1998 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා රු.මිලියන 74 ක් බස්නාහිර පළාත් සභාවට ගෙවා තිබුණද, අදාළ ඉඩම පවරා ගැනීමේ කටයුතු 2020 දෙසැම්බර් 31 දින වන විටත් සිදුකර නොතිබුණි. | ඉඩම පවරා ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය. | මෙතෙක් ගෙවීම් සිදු කර ඇත්තේ පවරා ගන්නා ලද කොටස් සඳහා වන බව හා ඉතිරි ඉඩම් ප්‍රමාණය ලබා ගැනීම සඳහා අඛණ්ඩව රැස්වීම් පවත්වනු ලබන බව. | ඉඩම අත්පත් කර ගැනීමේ කාර්යය සම්බන්ධීකරණය කිරීම සඳහා 2021 නොවැම්බර් මාසයේදී හිටපු අමාත්‍යාංශ ලේකම් වරයකු පත් කර තිබුණද 2022 ජනවාරි 31 දින වන විටත් ඉඩම පවරා ගැනීමට අපොහොසත්වී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු සඳහා විදේශගත වූ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 34 දෙනෙකු හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ දෙදෙනෙකු නැවත සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට රු.19,705,186 ක් බැඳුම්කර කඩවීම මත විශ්වවිද්‍යාලයට අයවිය යුතුව පැවතුණි. | බැඳුම්කර කඩවීම මත අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | 2020 වර්ෂයේ රු. 17,548,926.93 ක් අයකර ගැනීමට කටයුතු සිදු කර ඇත. තවද නිලධාරීන් 15 දෙනෙකු සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර නිලධාරීන් 12 දෙනෙකු සඳහා මූලික පරීක්ෂණ පැවැත්වීමටත් නිලධාරීන් 7 දෙනෙකුගේ අර්ථසාධක අරමුදලෙන් අයකර ගැනීමටද කටයුතු සිදු කරමින් පවතී. | 2022 ජනවාරි 31 දින වන විටත් අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. |
| (ඈ) | 2020 දෙසැම්බර් 31 දිනට ත්‍යාග හා ශිෂ්‍යත්ව අරමුදල් 102 ක් යටතේ පැවති රු. 35,527,763 කින්, අරමුදල් 98 ක් යටතේ වූ රු. 32,839,003 ක් අදාළ අරමුණ වෙනුවෙන් උපයෝජනය කිරීමකින් තොරව අක්‍රීයව පැවතුණි. | ත්‍යාග හා ශිෂ්‍යත්ව අරමුදල් පිහිටුවීමේ අරමුණු ඉටු කිරීම සඳහා මුදල් උපයෝජනය කළ යුතුය. | ශිෂ්‍යත්ව සහ ත්‍යාග අරමුදල් ආරම්භකොට ඇති විශේෂ අරමුණ හෝ පරමාර්ථ ලබා කර ගැනීමට සමත් වුවහොත් පමණක් උපයෝජයන කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් අරමුදල් 92 ක් යටතේ වූ රු.32,726,328 ක් උපයෝජනය කර නොතිබුණි. |

**5.** **කැලණිය විශ්වවිද්‍යාලය**

| වර්ෂය | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| විගණන මතය | තත්වාගණනය කළ මතය | වියාචනය කළ මතය | තත්වාගණනය කළ මතය |

| | විගණන නිරීක්ෂණය / ඌනතාවය | විගණකාධිපතිගේ නිර්දේශය | අස්ථීත්වයේ අදහස් දැක්වීම හා ගනු ලැබූ වැළැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | කථිකාචාර්යවරුන් 12 දෙනෙකු වෙත ආචාර්ය උපාධි සම්පූර්ණ කිරීම සඳහා වැටුප් සහිත අධ්‍යයන නිවාඩු හා ප්‍රාග්ධන ප්‍රදාන ලබාදී තිබුණද එම සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් තොරව නැවත සේවයට වාර්තා කර තිබුණු අතර ඔවුන්ගෙන් අයවිය යුතු බැඳුම්කර ගිවිසුම්වල වටිනාකම රු.54,791,505 ක් විය. | ආචාර්ය උපාධිය අදාළ කාලය තුළ නිමකර විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වර්ධනය කිරීමට දායක විය යුතුය. | කථිකාචාර්යවරුන් 08 දෙනෙකු ඉදිරියේදී ආචාර්ය උපාධි සම්පූර්ණ කිරීමට කටයුතු කරමින් පවතින බව හා කථිකාචාර්යවරුන් 04 දෙනෙකු ආචාර්ය උපාධිය සම්පූර්ණ කර නොමැති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් බැඳුම්කර වටිනාකම් අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. |
| (ආ) | සමාජීය විද්‍යා පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියෙකුගෙන් 2014 ජනවාරි සිට 2018 පෙබරවාරි දක්වා කාලය තුළ අධ්‍යන කටයුතුවලට සහභාගීවී නොතිබුණු නමුත් ඇයට වැටුප් හා දීමනා ලෙස රු.6,186,190 ක් ගෙවා තිබුණි. | දේශන පැවැත්වූ බව තහවුරු කර ගැනීම සඳහා ලිඛිත සාක්ෂි පවත්වා ගත යුතුය. | කථිකාචාර්යවරිය අධ්‍යයන කටයුතු සඳහා දායකවූ බව. | 2022 ජනවාරි 31 දින වන විටත් අධ්‍යයන කටයුතු සඳහා දායක වූ බව සනාථ කරගැනීමට ලිඛිත සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණු අතර මුදල අයකර ගෙනද නොතිබුණි. |
| (ඇ) | නියැදි පරීක්ෂාවකදී නිරීක්ෂණය වූ පරිදි රු.1,971,000 ක් වටිනා ක්‍රීඩා උපකරණ, රු.1,232,072 ක් වටිනා විද්‍යාගාර උපකරණ, රු.5,468,400 ක් වටිනා පරිගණක හා කාර්යාල උපකරණ 2018 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 01 සිට වර්ෂ 03 අතර කාලයක් තුළ නිෂ්ක්‍රීයව පැවතුණි. | ගොඩනැගිලි පහසුකම් ලබා ගැනීමෙන් පසු සැලසුම් සහගතව මිලදී ගැනීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය. | සුදුසු ස්ථානයක් කඩිනමින් ලබාදෙන බව සහ ඉන්පසු ඒවා භාවිතයට යොදා ගැනීමට කටයුතු කරන බව. | 2021 දෙසැම්බර් 31 දින දක්වාම නිෂ්ක්‍රීයව පැවතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | නාට්‍ය හා ප්‍රතිබිම්බ කලා ඒකකයේ චිත්‍රාගාරය සඳහා 2017 ජනවාරි 27 දින මිලදීගත් රු. 9,929,568 ක් වටිනා කැමරා, රූපවාහිනී හා පරිගණක යන්ත්‍ර ද, 2016 වර්ෂයේදී ලැබී තිබුණු පිරිවැය රු.4,124,830 ක්වූ කැමරා 5 ක් හා පරිගණක යන්ත්‍ර 7 ක් එම වර්ෂවල සිට විගණිත දිනය වූ 2020 ජූනි 26 දින දක්වාම නිෂ්කාර්යව පැවතුණි. | ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමෙන් පසු සැලසුම් සහගතව මිලදී ගැනීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය. | චිත්‍රාගාරය ඉදිකිරීමේ කටයුතු අවසන් කළ පසු මෙම උපකරණ භාවිතා කිරීමට නියමිත බව. | චිත්‍රාගාරයේ ඉදිකිරීම් කටයුතු නිමවී නොතිබීම හේතුවෙන් එම වත්කම් 2021 දෙසැම්බර් 31 දින වන විටත් නිෂ්ක්‍රීයව පැවතුණි. |
| (ඉ) | විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සඳහා වූ ආචාරධර්ම පද්ධතියට අනුව ශිෂ්‍යයින් සංවර්ධනය කිරීම හා ඉගැන්වීම මූලික අරමුණ බැවින් සියලුම ආචාර්යවරුන් නිරන්තරයෙන් පර්යේෂණ කටයුතු සිදුකළ යුතු වුවද, එම පර්යේෂණ ක්‍රියාත්මක කිරීම සඳහා ලැබී තිබුණු එකතුව රු. 8,096,327 ක්වූ අරමුදල් 29 ක් වර්ෂයකට වඩා වැඩි කාලයක් උපයෝජනය කර නොතිබුණි. | පර්යේෂණ සඳහා ලැබුණු අරමුදල් උපයෝජනය කර විශ්වවිද්‍යාලයේ කාර්යසාධනය ඉහළ නැංවීමට ක්‍රියාකළ යුතුය. | ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින පර්යේෂණ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගනු ලබන බව . | 2021 දෙසැම්බර් 31 වන විටත් මෙම අරමුදල් 29 උපයෝජනය කර නොතිබුණි. |

**6. රුහුණු විශ්වවිද්‍යාලය**

| වර්ෂය | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| විගණන මතය | තත්වාගණනය කළ මතය | තත්වාගණනය කළ මතය | තත්වාගණනය නොකළ මතය |

| විගණන නිරීක්ෂණය / ඌනතාවය | | විගණකාධිපතිගේ නිර්දේශය | අස්ථිත්වයේ අදහස් දැක්වීම හා ගනු ලැබූ වැළැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ V වන කොටසේ 29 (ඊ) වගන්තිය අනුව විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයින් නොවන තැනැත්තන්ට විශ්වවිද්‍යාලයේ උපාධි අභිඥාණ පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ලබා ගැනීමට හැකිවන පරිදි කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව බාහිර විභාග පැවැත්වීමට හැකි වුවත්, ශාස්ත්‍රවේදී බාහිර උපාධි පාඨමාලාව හැර වෙනත් උපාධි පාඨමාලා ආරම්භ කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි. | කාලීන අවශ්‍යතාවයන්ට සරිලන පරිදි උපාධි පාඨමාලා හඳුන්වාදීමට හා පැවැත්වීමට කටයුතු කළ යුතුය. | ශාස්ත්‍රවේදී (බාහිර) උපාධිය පමණක් දැනට පිරිනමනු ලබන බව හා සනාතන සභාවේ අනුමැතිය මත වාණිජවේදී (බාහිර) උපාධි පාඨමාලාව ආරම්භ කිරීමට අපේක්ෂිත බව. | 2022 ජනවාරි 31 දින වන විටත් වාණිජවේදී (බාහිර) උපාධි පාඨමාලාව ආරම්භ කිරීමට අදාළ යෝජනා පිළියෙල කිරීම පමණක් සිදුකර තිබුණි. |
| (ආ) | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ 40.1 වගන්තිය අනුව උසස් අධ්‍යාපන ආයතනයේ විවේක කාලවලදී නිවාඩු ගැනීමෙන් තමාගෙන් අදාළ ආයතනයට වියයුතු සේවයට අහිතකර බලපෑමක් ඇති නොවන්නේ නම්, යම් ආචාර්යවරයෙකුට විවේක කාලවලදී නිවාඩු ලබා ගත හැකිය. ඉංජිනේරු පීඨයේ ආචාර්යවරයෙකුට අධ්‍යයන කාලය තුළදී එනම් 2018 සැප්තැම්බර් 6 සිට 2018 දෙසැම්බර් 05 දක්වා හා 2019 ජනවාරි 12 සිට 2019 අප්‍රේල් 11 දක්වා වැටුප් සහිත විවේක නිවාඩු අනුමත කර තිබුණි. නමුත් මෙම කාලයන් දෙකම අධ්‍යයන කාලයන් වූ අතර අඛණ්ඩව අවස්ථා 02 ක් ද වී තිබුණි. | නිලධාරීන්ට නිවාඩු ලබා දීමේදී ආයතන සංග්‍රහයේ අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. | මෙම ආචාර්යවරයා ලබා ගෙන ඇති නිවාඩු, වැටුප් රහිත නිවාඩු සේ සළකා කටයුතු කිරීමටත්, අදාළ කාල පරිච්ඡේදය සඳහා ගෙවා ඇති වැටුප් හා දීමනා ආපසු අයකර ගැනීමටත් තීරණය කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මුදල අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2018 නොවැම්බර් 26 දිනැති අංක 15/2018 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව විශ්වවිද්‍යාල කාර්යමණ්ඩලය වෙනුවෙන් හඳුන්වාදී තිබුණ අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා විශ්වවිද්‍යාල ඒකාබද්ධ අරමුදලින් රු.මිලියන 20 ක් , විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදලින් රු.මිලියන 10 ක් හා ගිවිසුම් කඩකිරීම හේතුවෙන් සැපයුම් කරුවන්ගෙන් අයකර ගන්නා ලද මුදලින් රු.මිලියන 10 ක් වන පරිදි එකතුව රු.මිලියන 40 ක අග්‍රහාර රක්ෂණ අරමුදලක් පිහිටුවා තිබුණි. | අදාළ ආදායම් හා අරමුදල් ස්වයං උත්පාදිත අරමුදල් නොවන බැවින් අග්‍රහාර රක්ෂණ අරමුදලක් පිහිටුවීම සඳහා යෙදවිය නොහැකි අතර ඒවාට අදාළ නිශ්චිත අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් පමණක් යෙදවිය යුතුය. | පාලක සභාවේ අනුමැතිය මත රක්ෂණ අරමුදල සඳහා එම අරමුදල් ලබාගත් බව හා ඒවා භාණ්ඩාගාරයෙන් ලද අරමුදල් නොව විශ්වවිද්‍යාලය විසින් උත්පාදනය කර ගත් ආදායම්වලින් සමන්විත බව. | 2021 දෙසැම්බර් 31 දින වන විට අරමුදලේ ශේෂය රු.41,343,288 ක් වී තිබුණු අතර 2022 ජනවාරි 31 දින වන විටත් අරමුදල එලෙසම පවත්වාගෙන යමින් පැවතුණි. |
| (ඈ) | 2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය 4(i), 4(ii) හා 4(iii) ඡේද අනුව කටයුතු කිරීමකින් තොරව විශ්ව විද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයට 2014 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා පර්යේෂණ දීමනා ගෙවා තිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට කළමනාකරණ සේවා චක්‍රලේඛය විධිවිධාන අභිබවා චක්‍රලේඛ නිකුත් කළ නොහැකි බැවින් කළමනාකරණ සේවා චක්‍රලේඛයේ විධිවිධාන අනුව ක්‍රියා කළ යුතුය. | චක්‍රලේඛ අංක 02/2014 විශ්වවිද්‍යාලයන්හි පර්යේෂණ දීමනා ගෙවීම සඳහා අදාළ නොවන බව, ඒ සඳහා උසස් අධ්‍යාපන චක්‍රලේඛ අංක 1/2011 සහ 1/2011(I) අදාළ කරගත යුතු බව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 05/2014(I) මගින් උපදෙස් දී ඇති බැවින් ඒ අනුව අදාළ පර්යේෂණ දීමනා ගෙවීමට කටයුතු කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මෙම තත්ත්වය නිවැරදි කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | පර්යේෂණ දීමනා ලබාගත් අනධ්‍යයන කාර්ය මණ්ඩල නිලධාරීන් 04 දෙනෙක් දැනට විශ්වවිද්‍යාලය තුළ සේවයේ නොමැති අතර, එම නිලධාරීන් වෙත ගෙවා තිබුණු රු.858,745 ක පර්යේෂණ දීමනා වලට අදාළ පර්යේෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | පර්යේෂණ දීමනා ලබා ගන්නා සියලුම නිලධාරීන්ගෙන් පර්යේෂණ වාර්තා ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම නිලධාරීන් විශ්වවිද්‍යාලයේ සේවයේ යෙදී සිටියදී පර්යේෂණ යෝජනාව ඉදිරිපත් කර පර්යේෂණ දීමනා ලබාගත් බව, ඔවුන් ස්ථානමාරුවී ගිය අවස්ථාවේ සිට ගෙවීම් නතර කළ බව හා අවසන් වාර්තාව මෙම විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීම අපේක්ෂා නොකරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් පර්යේෂණ වාර්තා ලබා ගැනීමට හෝ මුදල් ආපසු අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| (ඊ) | කුරුදුවල අගය එකතු කිරීම තුළින් ගුණාත්මකව කුරුදුවල අපනයන වෙළඳපොළ වැඩිකර සුළු අපනයන ආර්ථිකය ශක්තිමත් කිරීම ප්‍රධාන අරමුණු කරගත් ව්‍යාපෘතියක් ජාතික විද්‍යා පදනම විසින් ආරම්භ කර තිබුණි. ප්‍රදේශය, කුරුදු වර්ගය, වයස සහ තැන්පත් කරන ලද කාලයට අනුව කුරුදුවල රසායනික සංයුතිය, ජීව ක්‍රියාකාරී සංඝටකවල වෙනස්වීම අධ්‍යයනය කර වඩාත් ඵලදායී කුරුදු අමුද්‍රව්‍ය නිර්දේශ කිරීම විශ්වවිද්‍යාලයට පැවරී තිබුණි. ව්‍යාපෘති කාලයෙන් 3/4 ක කොටසක් අවසන් වී ඇතත් ඉදිරිපත් කර තිබුණු ප්‍රගති වාර්තා අනුව Biochemical Profile එකට අදාළ Profile 50 කින්, Profile 02 කට අදාළව පමණක් පරීක්ෂා කර තිබුණි. තවද මෙම ව්‍යාපෘතිය මඟින් රු.3,955,000 ක් වැයකර 2018 අප්‍රේල් 26 දින GC උපකරණයක් මිලදී ගෙන තිබුණු නමුත් විගණිත දිනය වූ 2019 දෙසැම්බර් 31 දින වන විටත් එය කිසිදු පර්යේෂණ කටයුත්තකට භාවිතා කර නොතිබුණි. | පර්යේෂණ මාතෘකාවේ ඇතුළත්වන පරිදි සියලුම කරුණු ආවරණය වන ආකාරයට පරීක්ෂාවන් සිදුකර පර්යේෂණ අරමුණු කරා ළඟා වීමට ක්‍රියා කළ යුතුය. අවශ්‍යතාවය හඳුනා ගෙන ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුකළ යුතුය. | ජාතික විද්‍යා පදනම මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳව සෑහීමකට පත්ව ඇති බව වාර්තා වූයෙන් තවදුරටත් මෙය ගැටලුකාරී තත්ත්වයක් නොවන බව. | ව්‍යාපෘතිය අවසන් කර තිබුණු නමුත් 2022 ජනවාරි 31 දින වන විටත් වඩාත් ඵලදායී කුරුඳු අමුද්‍රව්‍ය පිළිබඳව කුරුඳු ගොවීන් වෙත සන්නිවේදනය කර නොතිබුණි. |
| (උ) | 200 වර්ෂයේදී නව නිපයුම් කොමිසම විසින් ලබාදී තිබුණු රෝද දෙකේ ට්‍රැක්ටරයේ අයිතිය අධ්‍යයනාංශයේ මහාචාර්යවරයෙකුගේ නමින් ලියාපදිංචි කර තිබුණි. | ව්‍යාපෘති වලින් ලැබෙන වත්කම් අදාළ අවස්ථාවේදී විශ්වවිද්‍යාලය නමින් පවරා ගත යුතුය. | මෙම රෝද දෙකේ ට්‍රැක්ටරය විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | 2022 ජනවාරි 31 දින වන විටත් වත්කම පවරා ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | ඉංජිනේරු පීඨයට අනුමත මහාචාර්ය තනතුරු 04 ම පුරප්පාඩු වී පැවතුණ අතර, විශ්ව විද්‍යාලයට අයත් පීඨ 09 හි කථිකාචාර්ය තනතුරු පුරප්පාඩු 154 ක් පැවතුණි. ඉන් වෛද්‍ය පීඨය, තාක්ෂණ පීඨය හා විද්‍යා පීඨයේ පුරප්පාඩු ප්‍රමාණය පිළිවෙලින් 32 ක්, 23 ක් හා 22 ක් තරම් ඉහළ අගයක් ගෙන තිබුණි. තවද අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ මාණ්ඩලික තනතුරු 14 ක හා මාණ්ඩලික නොවන තනතුරු 156 ක පුරප්පාඩු පැවතුණි. | තනතුරු පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කර ආයතනයේ දැක්ම කරා මානව සම්පත මෙහෙයවීමට ක්‍රියාකළ යුතුය. | ඉංජිනේරු පීඨයේ පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවා ඇතත් එම පීඨයේ මහාචාර්ය තනතුරු වලට අදාළව කිසිවකුත් අයදුම් කර නොතිබුණු බව, අනෙකුත් පීඨවල හා අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ පවතින පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවා ඇති බව හා අදාළ මූලික කටයුතු සිදු වෙමින් පවතින බව. | 2022 ජනවාරි 31 දින වන විටත් ඉංජිනේරු පීඨයට අනුමත මහාචාර්ය තනතුරු 04 ක්, අනෙකුත් පීඨවල කථිකාචාර්ය තනතුරු 51 ක් හා අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ මාණ්ඩලික තනතුරු 09 ක් හා මාණ්ඩලික නොවන තනතුරු 135 ක් පුරප්පාඩුව පැවතුණි. |

**7.** **යාපනය විශ්වවිද්‍යාලය**

| | | | |
|---|---|---|---|
| **වර්ෂය** | **2018** | **2019** | **2020** |
| **විගණන මතය** | **තත්වාගණනය කළ මතය** | **තත්වාගණනය කළ මතය** | **තත්වාගණනය කළ මතය** |

| | **විගණන නිරීක්ෂණය/ඌනතාවය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **අස්ථිත්වයේ අදහස් දැක්වීම හා ගනු ලැබූ වැළැක්වීමේ පියවර** | **වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2017 ජූලි 10 දිනැති අංක 10/2017 දරන චක්‍රලේඛය අනුව පැමිණීම් හා පිටවීම් ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සටහන් නොකළ විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයට 2018 වර්ෂය තුළදී වැටුප් හා දීමනා ලෙස රු.මිලියන 1,404 ක් ගෙවා තිබුණි. | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල විය යුතුය. | ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලවල අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් සාමාන්‍යයෙන් පැමිණීම හා පිටවීම ලිඛිතව සටහන් නොකරන අතර දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ඔවුන්ගේ පැමිණීම හා පිටවීම නිරීක්ෂණය කර තහවුරු කරන බව හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවද මෙම පැහැදිලි කිරීම් පිළිගත් බව. | 2022 ජනවාරි 31 දින වන විටත් පැමිණීම සහ පිටවීම ඇඟිලි සළකුණු යන්ත්‍රය මගින් තහවුරු කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. |
| (ආ) | ශිෂ්‍යත්ව සඳහා විදේශගත වූ අධ්‍යයන හා අනධ්‍යයන නිලධාරීන් 91 දෙනෙකු රාජකාරි සඳහා වාර්තාකර නොතිබුණි. එසේ වුවත්, 1987 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළ ගිවිසුම් උල්ලංඝනය කළ එම නිලධාරීන්ගෙන් ඊට අදාළ රු.මිලියන 68 ක බැඳුම්කර මුදල් අයකර නොතිබුණි. | විශ්වවිද්‍යාල කළමනාකාරිත්වය විසින් මෙම තත්ත්වය නිවැරදි කිරීමට සුදුසු පියවර ගත යුතුය. | බැඳුම්කර හා ගිවිසුම් පිළිබඳ කාරක සභාව මගින් බැඳුම්කර බැඳීම් වැඩි දියුණු කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග හඳුන්වාදී තිබුණු බව, මේ නිසා, පසුගිය කාලය තුළ පැහැර හැරීම් හා හිඟ ශේෂ විශාල ලෙස අඩු කර ගෙන ඇති බව හා මේ සඳහා වන නීතිමය අවශ්‍යතා වෙනුවෙන් ප්‍රතිපත්ති පත්‍රිකාවක් පිළියෙල කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් නිලධාරීන් 88 දෙනෙකුගෙන් රු.මිලියන 61 ක් අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2018 වර්ෂය සහ ඉකුත් වර්ෂ 03 තුළදී විශ්වවිද්‍යාලය විසින් පර්යේෂකයන්ට රු.43,577,638 ක් ගෙවා තිබුණි. එම පර්යේෂණවල ව්‍යාපෘති කාලසීමාව අවසන්වී ඇති අතර, පර්යේෂණ පිරිවැයෙන් සියයට 50 ක් පමණ මේ දක්වා ගෙවා තිබුණි. එහෙත්, එම පර්යේෂණවල ප්‍රගතිය හා අවසන් වාර්තා 2018 වර්ෂය අවසානය තෙක් පර්යේෂකයන් විසින් විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කර නොතිබුණි. | පර්යේෂකයන් විසින් සිය අවසන් වාර්තා නියමිත කාලය තුළ ඉදිරිපත් කළ යුතුය. | 2017 වර්ෂය හා 2018 වර්ෂය සඳහා කරන ලද පර්යේෂණවල අවසන් වාර්තා දැනට ඉදිරිපත් කරමින් පවතින බව. | 2022 ජනවාරි 31 දින වන විටත් එකතුව රු.1,890,700 කට අදාළ පර්යේෂණ වාර්තා 03 ක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 835 ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වූ ලංකා බැංකු පරිශ්‍රය හා මහජන බැංකුවේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පරිශ්‍රයෙහි වටිනාකම තක්සේරු කර නියමිත කුලී අය කිරීම සඳහා ගිවිසුම්ගතවී නොතිබුණි. මේ නිසා, වසර 16 කට වැඩි කාලයක සිට සැලකිය යුතු කුලී ආදායමක් අයකරගත නොහැකි වී තිබුණි. | මුදල් රෙගුලාසිවලට අනුකූල විය යුතුය. | තක්සේරු වාර්තා ලබා ගැනීමටත්, කුලී ගිවිසුම් අත්සන් කිරීමටත් පියවර ගෙන ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් ලංකා බැංකුව සමඟ ගිවිසුම්ගතවීමට අපොහොසත්වී තිබුණි. |
| (ඉ) | සේවය තහවුරු කිරීම සඳහා අවශ්‍ය පශ්චාත් උපාධි සුදුසුකම් ලබා නොතිබීම නිසා කථිකාචාර්යවරියකගේ සේවය 2016 අප්‍රේල් මාසයේ සිට අවසන් කර තිබුණද, එදින සිට බලපැවැත්වෙන පරිදි තාවකාලික කථිකාචාර්ය තනතුරකට පත් කර තිබුණි. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2017 සැප්තැම්බර් 06 දිනැති අංක 13/2017 දරන ආයතන චක්‍රලේඛයට අනුකූලව, මාර්ගගත ඉගෙනුම් ක්‍රමයෙන් ලබාගත් පශ්චාත් උපාධිය, සේවය ස්ථිර කිරීම හා උසස් කිරීම සඳහා නොපිළිගැනේ. එසේ වුවද, 2008 | විශ්වවිද්‍යාල පනතට අනුකූල විය යුතුය. | ආචාර්ය උපාධිය සම්පූර්ණ කළ බවට වූ සහතිකය ඉදිරිපත් නොකළ ඇයගේ සේවය අත්හිටුවා කථිකාචාර්ය තනතුරක ස්ථිර කර පසුව ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුර දක්වා උසස් කිරීමට තේරීම් කමිටු නිර්දේශය මත ක්‍රියාත්මක කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් විශ්වවිද්‍යාල කළමනාකාරිත්වය විසින් මෙම තත්ත්වය නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | අප්‍රේල් මාසයේ සිට බලපැවැත්වෙන පරිදි ඇය කථිකාචාර්ය තනතුරේ ස්ථිර කර, 2016 දෙසැම්බර් මාසයේ සිට බලපැවැත්වෙන පරිදි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය දක්වා උසස් කර තිබුණි. | | | |
| (ඊ) | අනිවාර්ය නිවාඩු යැවූ සහකාර කථාකාචාර්යවරයෙකු මහාචාර්යවරයෙකු දක්වා උසස් කර ඔහුගෙන් විශ්ව විද්‍යාලයට කිසිදු සේවාවක් ලබා නොගෙන 2013 ඔක්තෝබර් සිට 2021 පෙබරවාරි දක්වා කාලය වෙනුවෙන් රු. 26,315,186ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මීට එරෙහිව නීතිමය පියවර ගෙන ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විට නඩු තීන්දුව ලැබී නොතිබුණි. |
| (උ) | අපේක්ෂිත අරමුණු සඳහා උපයෝජනය නොකළ රු.1,990,474 ක් වර්ෂ 09ක කාලයක සිට ජංගම නොවන වගකීම් යටතේ පවතී. | අප්‍රමාදව අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කළ යුතුය . | ඉටු කළ යුතු කාර්යයන් කිසිවක් මෙම මුදල් ලබා දුන් පරිත්‍යාගශීලීන් විසින් නියම කර නොතිබුණු බව හා කමිටුවේ උපදෙස් ලද විගස මෙම මුදල් භාවිතා කිරීමට පියවර ගනු ලබන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් එම අරමුදල් උපයෝජනය කර නොතිබුණි. |
| (ඌ) | 2015 සැප්තැම්බර් 18 දිනැති අංක 13/2015 සහ 2016 ජනවාරි 09 දිනැති අංක 13/2015(i) දරන ආයතන චක්‍රලේඛවලට පටහැනිව, 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වැඩබලන සේවා කාලය වෙනුවෙන් වාහන හා ඉන්ධන දීමනා ලෙස රු.2,450,360 ක් විශ්ව විද්‍යාලයේ මූල්‍යාධිකාරීවරයෙකුට (Bursar) ගෙවා තිබුණි. | අදාළ ගෙවීම් අය කළ යුතුය. | වැඩබලන මූල්‍යාධිකාරී 2013 දෙසැම්බර් 21 සිට 2018 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ සේවය කර ඇති බව, අංක 13/2015 දරන චක්‍රලේඛය අනුව වැඩබලන මූල්‍යාධිකාරීවරයෙකු මෙම ගෙවීම් සඳහා සුදුසුකම් ලබන බව, 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ වූ පරිදි, කාර්ය පරිපාටික රීතිවල IX වැනි පරිච්ඡේදයේ 119 වන ඡේදයේ සඳහන් විධිවිධාන අනුව වැඩබලන මූල්‍යාධිකාරීවරයෙකුට ප්‍රවාහන හා ඉන්ධන දීමනා ගෙවා ඇති බව. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මෙම ගෙවීම් කළ නොහැකි බව ලිඛිතව දන්වා තිබියදී වාහන හා ඉන්ධන දීමනා ගෙවා තිබුණු අතර 2022 ජනවාරි 31 දින වන විටත් මෙම මුදල් ආපසු අයකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (එ) | 2015 වර්ෂයේදී රජයෙන් ලද ඉඩම්, ගොඩනැගිලි හා වාහන 02 ක් විශ්වවිද්‍යාලය මගින් පරිහරණය කර තිබුණද, එම වත්කම් ගිණුම්ගත කිරීමට හා ඒවායේ හිමිකම පවරා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | දේපළ අයිතිය පවරා ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. | මෙම වත්කම් කඩිනමින් පවරා ගැනීම සඳහා පියවර ගනිමින් පවතින බව. | 2022 ජනවාරි 31 දින වන විටත් දේපළවල හිමිකාරිත්වය පවරා ගැනීමට අපොහොසත්වී තිබුණි. |
| (ඒ) | 2014 සිට 2019 දක්වා වූ අධ්‍යයන නිවාඩු කාලය තුළ, පශ්චාත් උපාධි හැදෑරීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 07 දෙනෙකු සඳහා විශ්වවිද්‍යාලය මගින් රු.17,027,348 ක් වැය කර තිබුණි. ඔවුන් සිය උපාධිය සම්පූර්ණ නොකර නැවත රාජකාරි ආරම්භ කර තිබුණද, 2010 පෙබරවාරි 05 දිනැති අංක 920 දරන චක්‍රලේඛය පරිදි, එම වියදම් අය කර ගැනීමට විශ්වවිද්‍යාලය නිසි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | චක්‍රලේඛ අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කළ යුතුය. | අධ්‍යයනය අවසන් කර වාර්තාව ලැබුණු වහාම මෙම ගැටලුව විසඳීමට කටයුතු කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් අදාළ නිලධාරීන් එම උපාධිය සම්පූර්ණ නොකර රාජකාරියේ නියැලෙන නමුත් වැය කළ මුදල් ඔවුන්ගෙන් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. |

**8.** **ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**------------------------------**

| | | | |
|---|---|---|---|
| **වර්ෂය** | **2018** | **2019** | **2020** |
| **විගණන මතය** | **තත්වාගණනය කළ මතය** | **තත්වාගණනය නොකළ මතය** | **තත්වාගණනය කළ මතය** |

| | **විගණන නිරීක්ෂණය / ඌනතාවය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **අස්ථිත්වයේ අදහස් දැක්වීම හා ගනු ලැබූ වැළැක්වීමේ පියවර** | **වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 102, 103, 104, හා 2016 පෙබරවාරි 12 දිනැති අංක 02/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2018, 2019 හා 2020 වර්ෂවලදී පිළිවෙලින් රු.19,517,405 ක්, රු.2,637,980 ක් හා රු.2,891,380 ක් වූ භාවිතයෙන් ඉවත්කළ හා හානි වූ පොත් තොග කපාහැරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව විශ්වවිද්‍යාල පාලක මණ්ඩලයේ අනුමැතිය මත පමණක් කපාහැරීම සිදුකර තිබුණි. තවද, තොග ඌනතා, අතිරික්තා සම්බන්ධයෙන්ද ආරම්භයේ සිටම මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | තොග සමීක්ෂණ වලින් හඳුනාගත් තොග ඌනතා, අතිරික්තතා හා ඉවත්කිරීම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදුන් බව. | මේ සම්බන්ධයෙන් නිලධාරීන්ට උපදෙස් ලබාදී නොතිබුණු අතර 2022 ජනවාරි 31 දින වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | අතිරික්ත පොත් මුද්‍රණය කිරීම හේතුවෙන් 2018 වර්ෂයේ පිරිවැය රු.21,283,087 ක්වූ පොත් 121,248 ක් ඉවත් කිරීමට කටයුතු කර තිබුණි. | අනවශ්‍ය ලෙස පොත් මුද්‍රණය කිරීම වළක්වා ගැනීම සඳහා ගිණුම් කාරක සභාව විසින් යෝජනා කළ පරිදි පත්කළ කමිටු නිර්දේශයන් ක්‍රියාත්මක කළ යුතුය. | පාඨමාලා සඳහා අයදුම් කරන ලද සිසුන් සියළුදෙනා එම පාඨමාලාව සඳහා ලියාපදිංචි නොවීම, පාඨමාලා පොත් වරින් වර සංශෝධනයට ලක්වීම යන කරුණු මීට හේතුවූ බව හා නිවැරදි පුරෝකථනයන් ඇසුරින් පොත් අතිරික්තයන් අවම කිරීමට කටයුතු කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මුද්‍රණයට අවශ්‍ය ප්‍රශස්ථ පොත් සංඛ්‍යාව තීරණය කළ හැකි ක්‍රමවේදයක් හඳුන්වාදී නොතිබුණි. |

**9. ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය**

| | | | |
|---|---|---|---|
| **වර්ෂය** | **2018** | **2019** | **2020** |
| **විගණන මතය** | **තත්වාගණනය නොකළ මතය** | **තත්වාගණනය කළ මතය** | **තත්වාගණනය කළ මතය** |

| **විගණන නිරීක්ෂණය/ඌනතාවය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **අස්ථිත්වයේ අදහස් දැක්වීම හා ගනු ලැබූ වැළැක්වීමේ පියවර** | **වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|
| විශ්වවිද්‍යාලයේ කොළඹ පරිශ්‍රයේ මහල් පහකින් සමන්විත ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු.මිලියන 307.5 ක ඉංජිනේරු ඇස්තමේන්තුවක් මත නිර්මාණ සහ ඉදිකිරීම් ප්‍රසම්පාදන ක්‍රමය යටතේ 2017 වර්ෂයේදී මිල ගණන් කැඳවා තෝරාගත් කොන්ත්‍රාත්කරුට 2019 දෙසැම්බර් 05 දින රු.14,508,834 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරමක් ගෙවා තිබුණි. එහෙත් 2021 නොවැම්බර් 19 දින වන විටත් ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි. එසේම එකතුව රු. මිලියන 526.5 ක් වූ ප්‍රසම්පාදන 02 ක් වෙනුවෙන් තාක්ෂණික ඇගයීම් කමිටු සඳහා රේඛීය අමාත්‍යාංශයේ නියෝජිතයකු පත් කිරීම වෙනුවට විශ්‍රාමික අතිරේක ලේකම්වරයකු පත්කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුවන අතර ඉදිකිරීම් කඩිනම් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. | මෙම ව්‍යාපෘතිය කොළඹ 07 බෞද්ධාලෝක මාවතේ අධිආරක්ෂිත කලාපයක පිහිටා තිබීම හේතුවෙන් මෙම ඉදිකිරීම ආරම්භ කිරීමට පෙර නාගරික සංවර්ධන අධිකාරිය මඟින් අනුමැතිය ලබා ගත යුතුවූ බව හා එම අනුමැතිය ලද පසු ඉදිකිරීම් ආරම්භ කිරීමට නියමිත බව. | 2022 ජනවාරි 31 දින වන විටත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණු අතර කොන්ත්‍රාත්කරු වෙත වැඩබිම භාරදීමට ඇති හැකියාව පිළිබඳව තහවුරු කර ගැනීමකින් තොරව වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් නිකුත් කළ වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

## 10. ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය

-----------------------------------

| වර්ෂය | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| විගණන මතය | තත්වාගණනය කළ මතය | තත්වාගණනය කළ මතය | තත්වාගණනය කළ මතය |

| | විගණන නිරීක්ෂණය/ඌනතාවය | විගණකාධිපතිගේ නිර්දේශය | අස්ථිත්වයේ අදහස් දැක්වීම හා ගනු ලැබූ වැළැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3(1) වගන්තිය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2017 ජූලි 10 දිනැති අංක 10/2017 දරන චක්‍රලේඛය අනුව සියලුම කාර්යමණ්ඩලය තම පැමිණීම් හා පිටවීම් ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සටහන් කළ යුතු වුවත් අධ්‍යයන කාර්යමණ්ඩලය ඒ අනුව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව පැමිණීම් සහ පිටවීම් ඇඟිලි සලකුණු සටහන් යන්ත්‍රවල සටහන් කිරීමට කටයුතු කළ යුතුය. | සම්ප්‍රදායට අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලය අනෙකුත් සියලුම විශ්වවිද්‍යාලවල මෙන් ඔවුන්ගේ පැමිණීම සටහන් නොකරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මෙම තත්ත්වය නිවැරදි කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කවල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.536,453,179 ක් වූ දේපල, පිරියත හා උපකරණ 2019 වසර අවසාන වන විට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් 2020 වසර අවසන් වන විට තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. | වත්කම් නැවත තක්සේරු කිරීමට කටයුතු කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 43, 45 සහ 72 ඡේද ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ ස්ථාන 11 ක පිහිටි හෙක්ටයාර 210 ක පමණ වූ ඉඩම්වල අගය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. | ඉඩමේ අයිතිය ලබා ගැනීමට හා ගොඩනැගිලි නැවත තක්සේරු කිරීමට කටයුතු කරමින් පවතින බව. | 2022 ජනවාරි 31 දින වන විටත් නැවත තක්සේරු කිරීමේ ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි. |
| (ඇ) | බැංකු ගිණුම් 3 ක එකතුව රු.4,060,132 ක් වූ සෘජු හර කිරීම් මූල්‍ය ප්‍රකාශනවල වියදම් ලෙස හඳුනාගැනීමකින් තොරව බැකු සැසඳුම් ප්‍රකාශයේ හඳුනානොගත් හර ශේෂ ලෙස දක්වා තිබුණි. එමෙන්ම, බැංකු ගිණුම් 3 ක හඳුනා නොගත් තැන්පතු එකතුව රු.1,608,236 ක් වර්ෂ 12 කට වැඩි කාලයක සිට නිරවුල් කර නොතිබුණි. | හඳුනානොගත් හර කිරීම් හා හඳුනා නොගත් තැන්පතු නිරවුල් කළ යුතුය. | කපා හැරීමට කටයුතු කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් හඳුනානොගත් හර කිරීම් හා හඳුනා නොගත් තැන්පතු නිරවුල් කර නොතිබුණි. |
| (ඉ) | 2020 දෙසැම්බර් 31 දිනට වර්ෂ 3 සිට වර්ෂ 38 ක කාලයක් තුළ එකතුව රු.155,332,578 ක් වූ කථිකාචාර්යවරු 71 දෙනෙකුගෙන් අයකර ගත යුතු බැඳුම්කර වටිනාකම අයකර ගෙන නොතිබුණි. | බැඳුම්කර වටිනාකම කාලීනව අයකර ගත යුතුය. | නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් බැඳුම්කර වටිනාකම අයකරගෙන නොතිබුණි. |
| (ඊ) | 2020 දෙසැම්බර් 31 දිනට වර්ෂ 03 සිට වර්ෂ 15 දක්වා කාලයක සිට පැවතෙන එකතුව රු. 20,839,969 ක් වූ ලැබිය යුතු සේවක ණය හා අත්තිකාරම් සහ එකතුව රු. 84,161,724 ක් වූ බාහිර පාර්ශව වලින් ලැබිය යුතු මුදල් අයකර ගැනීමකින් තොරව හිඟව පැවතුණි. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම මුදලින් වැඩි ප්‍රමාණයක් 1998 වර්ෂයේ සිට පැවත එන ශේෂ වන බව, ඒ සම්බන්ධ කිසිදු වාර්තාවක් නොමැති බව හා අදාළ බලධාරීන්ගේ අනුමැතිය ඇතිව කපා හැරීමට කටයුතු කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මේ සම්බන්ධයෙන් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | ජංගම වගකීම ලෙස වර්ෂ 03 සිට වර්ෂ 15 දක්වා කාලයක සිට පැවතෙමින් එන එකතුව රු.20,810,414 ක් වූ විවිධ ණය හිමියන් හා අනෙකුත් ගෙවිය යුතු මුදල් නිරවුල් කිරීමට විශ්වවිද්‍යාලය විසින් කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු මුදල් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | සමහර ශේෂ වසර දහයකට වැඩි කාලයක සිට ඉදිරියට එන ශේෂ වන බව හා ඒ පිළිබඳ ලියකියවිලි නොමැති බව සහ ගිණුම් පොත් වලින් කපා හැරීමට කටයුතු කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මේ සම්බන්ධයෙන් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඌ) | 2019 වර්ෂය සඳහා වන භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව වටිනාකම රු.1,379,602 ක් වූ වට්ටෝරු භාණ්ඩ අයිතමය 139 ක ඌනතාවය සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | තොග ඌනතාවය පිළිබඳ පරීක්ෂණයක් කළ යුතුය. | මෙම ඌනතාවය නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතින බව. | 2022 ජනවාරි 31 දින වන විටත් තොග ඌනතාවය නිවැරදි කිරීමට හෝ ඒ පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වීමට හෝ කටයුතු කර නොතිබුණි. |
| (එ) | 2020 දෙසැම්බර් 31 දින වන විට රු.127,141,236 ක් වූ පුස්තකාල පොත් පිළිබඳ ආයතනය ආරම්භ කළ දින සිට සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | පුස්තකාල පොත් පිළිබඳ සමීක්ෂණයක් කළ යුතුය. | පොත් සහ වාර සඟරා 98,000 කට ආසන්න ප්‍රමාණයක් ඇති බව හා කොටස් වශයෙන් සමීක්ෂණය කිරීමේ ක්‍රියාවලිය වර්ෂ 3 කට පෙර ආරම්භ කළ බව. | 2022 ජනවාරි 31 දින වන විටත් තොග සමීක්ෂණය අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඒ) | අනුමත අධ්‍යයන කාර්යමණ්ඩලය 285 ක් වූ අතර තත්‍ය අධ්‍යයන කාර්යමණ්ඩලය 218 ක් විය. මේ අනුව පුරප්පාඩු සංඛ්‍යාව 67 ක් වූ අතර, ඉන් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පුරප්පාඩු සංඛ්‍යාව 15 ක් විය. අනධ්‍යයන කාර්යමණ්ඩල පුරප්පාඩු සංඛ්‍යාව 120 ක් විය. විශ්වවිද්‍යාලය විසින් 2020 වසර අවසාන වන විටත් මෙම පුරප්පාඩු පිරවීම සිදු කර නොතිබුණි. | ප්‍රමාදයකින් තොරව පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. | විශ්වවිද්‍යාලය අවස්ථා ගණනාවකදී පුරප්පාඩු තනතුරු පිළිබඳව වරින් වර ප්‍රචාරය කිරීමට කටයුතු කළ නමුත් සුදුසු අයදුම්කරුවන්ගේ අඩුකම ගැටළුවක්වී ඇති බව හා අයදුම්පත් ඉදිරිපත් කර නොමැති නිසා මහාචාර්ය සේවක සංඛ්‍යාවද පුරප්පාඩුවී ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. |

**11. ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය**

| වර්ෂය | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| විගණන මතය | තත්වාගණනය නොකළ මතය | තත්වාගණනය කළ මතය | තත්වාගණනය කළ මතය |

| විගණන නිරීක්ෂණ/ ඌනතාවය | විගණකාධිපතිගේ නිර්දේශය | අස්ථිත්වයේ අදහස් දැක්වීම හා ගනු ලැබූ වැළැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් වල ඵලදායී ජීවිත කාලය සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.893,887,711 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කිරීමට කටයුතු කරමින් පවතින බව හා ඉන් පසු මෙම අඩුපාඩු සියල්ලම ඉවත් කිරීමට හැකියාව පවතින බව. | 2022 ජනවාරි 31 දින වන විටත් ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය සමාලෝචනය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2011 සිට 2012 වර්ෂය දක්වා කාලසීමාව සඳහා ආරක්ෂක සේවා ගිවිසුම් කොන්දේසිවලට පටහැනිව රු.9,432,774 ක් අමාත්‍යාංශ ලේකම්ගේ ඉල්ලීම අනුව ආරක්ෂක සේවා සමාගමක් වෙත ගෙවා තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකළ වගකිව යුතු අය හඳුනාගෙන ඒ සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කළ යුතුය. | 2017 ජූලි මාසයේ පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී මේ සඳහා පිළිතුරු ලබාදී ඇති බව. | 2017 අගෝස්තු 09 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් මෙය නීත්‍යානුකූල නොවන ගෙවීමක් බව පිළිගෙන තිබුණු නමුත් 2022 ජනවාරි 31 දින වන විටත් ඒ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ස්ථාවර වත්කම් ලේඛනය සඳහා මෘදුකාංගයක් සැකසීම හා දත්ත ඇතුළත් කිරීම සඳහා 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා එකතුව රු.1,370,300 ක් ගෙවා තිබුණද, 2020 දෙසැම්බර් 31 දින වන විටත් ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීමට කටයුතු කළ යුතුය. | ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීමේ සියලුම කටයුතු විශ්වවිද්‍යාලය මඟින් සිදු කිරීමට තීරණය කර ඇති බැවින් පැරණි ගිවිසුම අවලංගු කළ බව, ඒ අනුව, ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීම හා එහි සියලු කටයුතු අධීක්ෂණය කිරීම සඳහා කමිටුවක් පත්කරන ලද අතර, එම කමිටුව අවසන්වරට රැස් වූ අවස්ථාවේදී සාකච්ඡා කළ පරිදි ස්ථාවර වත්කම් හඳුනාගැනීම, කේතකරණය හා පරිගණක පද්ධතිය සකස් කිරිමේ කටයුතු සිදුකරමින් පවතින බව. | 2022 ජනවාරි 31 දින වන විටත් ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීමේ කටයුතු අවසන් කර ගැනීමට හෝ ගෙවූ මුදල් ආපසු අයකර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | 2016 ජුනි මාසයේ දී රු.15,964,000 ක් වැයකර මිලදී ගෙන තිබුණු Desktop පරිගණක යන්ත්‍ර 130 ක් නියමිත පිරිවිතරවලට අනුකූල නොවීම සම්බන්ධයෙන් 2018 පෙබරවාරි මාසයේදී ත්‍රිපුද්ගල පරීක්ෂණ මණ්ඩලයක් පත්කර තිබුණි. 2018 මැයි 19 දිනැති පරීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව සමස්ථ ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ වගකීම් විරහිත ලෙස කටයුතු කර ඇති නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළයුතු බව නිගමනය කර තිබුණද, 2021 අප්‍රේල් වන විටත් විනයානුකූල ක්‍රියාමාර්ග ආරම්භ කර නොතිබුණි. 2018 ජුනි 21 දින රු.1,596,400 ක් වූ රඳවුම් මුදල් ද කොන්ත්‍රාත්කරු වෙත නිදහස් කර තිබුණි. | සියළු මිලදී ගැනීම් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල විය යුතු අතර, ඊට පටහැනිව කටයුතු කර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ පරිදි විනයානුකූලව කටයුතු කළ යුතුය. | රඳවුම් මුදල නිදහස් කර ඇත්තේ කමිටු නිර්දේශය මත බව හා කමිටු නිර්දේශය පිළිබඳව සලකා බලා ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදු කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් විනයානුකූල ක්‍රියාමාර්ග ආරම්භ කර නොතිබුණි. |

**12.** **ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය**

**-------------------------------**

| **වර්ෂය** | **2018** | **2019** | **2020** |
|---|---|---|---|
| **විගණන මතය** | **තත්වාගණනය කළ මතය** | **තත්වාගණනය කළ මතය** | **තත්වාගණනය කළ මතය** |

| | **විගණන නිරීක්ෂණ/ ඌනතාවය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **අස්ථිත්වයේ අදහස් දැක්වීම හා ගනු ලැබූ වැළැක්වීමේ පියවර** | **වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.540,145,707 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂයකර තිබුණු නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට 2020 වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. | වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට ඇතුළත් කිරීමට අදාළ මූලික කටයුතු සියල්ල අවසන් කර ඇති බව හා 2021 වර්ෂයේදී එම කටයුතු නිම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | 2022 ජනවාරි 31 දින වන විටත් ප්‍රත්‍යාගනණ කටයුතු අවසන් කිරීමට අපොහොසත්වී තිබුණි. |
| (ආ) | විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ප්‍රදාන සම්බන්ධයෙන් වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.10 වගන්තිය ප්‍රකාරව ලබා ගන්නා ලද පර්යේෂණ අත්තිකාරම් දින 90 ක් තුළ පියවිය යුතු වුවද, විශ්වවිද්‍යාල අරමුදලින් සහ වෙනත් අරමුදල් වලින් කථිකාචාර්වරුන් 11 දෙනෙක් වෙත ලබාදී තිබුණු එකතුව රු.2,662,233ක් වූ අත්තිකාරම් 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වසර 1 සිට වසර 13 ක කාලයක් ගතවී තිබුණද පියවීමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් නොකරන ලද අත්තිකාරම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | මුදල් අය කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බව. | 2021 දෙසැම්බර් 31 දින වන විටත් මෙම අත්තිකාරම් පියවා නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2012 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයේ සිට පැවතෙන එකතුව රු.2,297,392ක් වූ ටෙන්ඩර් තැන්පතු හා වර්ෂ 02 සිට වර්ෂ 16 දක්වා කාලයක සිට පැවතෙන එකතුව රු.68,157,974ක් වූ කොන්ත්‍රාත් හා විවිධ රැඳවුම් මුදල් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මෙම රඳවා ගැනීම්වල තිබෙන මුදල් පසුගිය වසරේ සිට අදාළ ආදායකයින් විමසා ඔවුනට ගෙවීමට කටයුතු සිදුකරමින් පවතින බව හා ඉතිරි මුදල් ඉදිරියේදී නිදහස් කිරීමට කටයුතු කරන බව. | 2021 දෙසැම්බර් 31 දින වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඈ) | සෑම උසස් අධ්‍යාපන ආයතනයකම සේවයේ නියුතු සෑම තැනැත්තෙක්ම පැමිණීමේ හා පිටවීමේ වේලාව සටහන් කළ යුතු වුවද අධ්‍යයන කාර්ය මණ්ඩලය ඒ අනුව කටයුතු කර නොතිබුණි. | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල පද්ධතිය තුළ දැනට ක්‍රියාත්මක කරනු ලබන ක්‍රමය අප විශ්වවිද්‍යාලයේද ක්‍රියාත්මක කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් පැමිණීම හා පිටවීම සටහන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඉ) | පශ්චාත් උපාධි කටයුතු සඳහා වැටුප් සහිත නිවාඩු ලබා ගෙන එහෙත් පශ්චාත් උපාධිය සම්පූර්ණ කර නොතිබුණු කථිකාචාර්යවරු 08 දෙනකු දැනට සේවයේ නියැලී සිටියද ඔවුන්ගෙන් අයකර ගත යුතු එකතුව රු.35,621,947 ක් වූ බැඳුම්කර වටිනාකම 2020 වර්ෂය අවසානය දක්වාම අයකරගෙන නොතිබුණි. | පශ්චාත් උපාධිය සම්පූර්ණ නොකරන නිලධාරීන්ගෙන් අයවිය යුතු බැඳුම්කර වටිනාකම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | පශ්චාත් උපාධි පාඨමාලාව අවසන් වීමට නියමිත දින දක්වා ප්‍රගති වාර්තා ඉදිරිපත් කරන ලෙස කථිකාචාර්යවරුන් 04 දෙනෙකු වෙත දන්වා ඇති බව, එක් කථිකාචාරයෙකුගෙන් බැඳුම්කරයට අදාළ මුළු බැඳුම්කර වටිනාකම එක්මසක් ඇතුළත අයකරගැනීමටද, තවත් කථිකාචාර්යවරයෙකු සම්බන්ධයෙන් "බැඳුම්කර උල්ලංඝණය කිරීම් සහ සමාලෝචන" කමිටුව මඟින් ලබාදුන් තීරණය ක්‍රියාත්මක කිරීමටද තීරණය කර ඇති බව. | 2021 දෙසැම්බර් 31 දින වන විටත් මෙම මුදල් අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | 2016 වර්ෂයේ සේවය හැර ගොස් ඇති කථිකාචාර්යවරයෙකුගෙන් අයවිය යුතු රු.411,844 ක බැඳුම්කර මුදල සහ දර්ශනපති උපාධිය හැදෑරීම සඳහා අධ්‍යයන නිවාඩු ලබාගෙන උපාධිය සම්පූර්ණ නොකිරීම මත සේවය අවසන් කර තිබුණු ආචාර්යවරයෙකුගෙන් අයවිය යුතු රු.3,784,401ක බැඳුම්කර මුදල 2020 වර්ෂය අවසානය දක්වාම අයකර ගෙන නොතිබුණි. | අයවිය යුතු බැඳුම්කර මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | විශ්වවිද්‍යාලය වෙත අයවීමට ඇති රු.411,844 ක මුදල ඔහුගේ අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමටත් ආචාර්යය ඩබ්.එම්.එස්.ප්‍රනාන්දු මහතා වෙත නව බැඳුම්කරයක් අත්සන් කර ගැනීමට අධ්‍යයන ආයතන අංශයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී වෙත දැනුම් දීමටද තීරණය කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටද මුදල් අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. |
| (උ) | විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ හා උතුරු මැද පළාත් සභාව එක්ව ක්‍රියාත්මක කළ "ගම" ව්‍යාපෘතියේ දත්ත පරිගණක ගත කිරීම, විශ්ලේෂණය හා වාර්තා කිරීමේ කටයුතු සඳහා පළාත් සභාව විසින් විශ්වවිද්‍යාල අරමුදලට බැර කළ යුතු රු.7,108,000 ක් වූ මුදල අධ්‍යයන අංශයේ නිලධාරීන් තිදෙනකුගේ පෞද්ගලික ගිණුම්වලට බැර කර තිබුණු අතර ඒ තුළ විශ්වවිද්‍යාලයේ විද්‍යාගාරය භාවිතා කිරීම වෙනුවෙන් ලබාදී තිබුණු රු.150,000 ක මුදලක්ද ඇතුළත්ව තිබුණි. | විශ්වවිද්‍යාල අරමුදලට අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධයෙන් පාලක සභාව විසින් කමිටුවක් පත්කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටද මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඌ) | විශ්වවිද්‍යාලයට ඉංජිනේරු පීඨයක් ස්ථාපිත කිරීම සඳහා 2014 වර්ෂයේ සිට සැලසුම්කර විෂය නිර්දේශය සැකසීම සහ විවිධ වියදම් වෙනුවෙන් විශ්වවිද්‍යාලීය අරමුදලින් රු. 6,120,913 ක් වැය කර තිබුණි. විශ්වවිද්‍යාලය විසින් සාම්ප්‍රදායික විෂය මාලාවෙන් බැහැරව විශේෂිත වූ විෂය මාලාවක් සකස් නොකිරීම හේතුවෙන් 2019 දෙසැම්බර් 24 දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම් විසින් ඉංජිනේරු පීඨය ස්ථාපිත කිරීමට අදාළ ව්‍යාපෘති යෝජනාව තාවකාලිකව අත්හිටුවා තිබුණි. ඒ අනුව විශ්වවිද්‍යාලීය අරමුදලින් දරන ලද ඉහත වියදම නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | ඉංජිනේරු පීඨයක් ස්ථාපිත කිරීමට කටයුතු නොකරන්නේ නම් දරන ලද වියදම් වගකිව යුතු පුද්ගලයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | නව ඉංජිනේරු පීඨයක් ස්ථාපිත කිරීමට විශ්වවිද්‍යාලය විසින් පාලක සභා හා සනාතන සභාවේ නිර්දේශ හා අනුමැතිය මත කමිටුවක් පත්කර ඇති බව හා ඉදිරියේදී මෙම කමිටුව විසින් ගනු ලබන තීරණයන් අදාළ අංශ වලට යොමු කර ක්‍රියාමාර්ග ගනු ලබන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් ඉංජිනේරු පීඨය ස්ථාපිත කිරීම සඳහා කාර්යක්ෂම වැඩපිළිවෙලක් සකස්කර නොතිබුණු අතර ඒ සඳහා පත්කළ කමිටුව විසින්ද තීරණයක් ලබාදී නොතිබුණි. |
| (එ) | සැලසුම් කර ඉදිකිරීමේ ක්‍රමය මත ඉදිකිරීම් සිදු කළ විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යාපීඨයේ තාක්ෂණ අංශයේ ගොඩනැගිල්ලෙහි රසායනාගාර 3 ක් සඳහා විදුලි හා එල් පී ගෑස් සැපයුම සමඟ FUME Cupboard 6 ක් සවිකර නොතිබියදී එම අයිතම සඳහාද ගෙවීම් කර තිබුණි. එම කාර්යය වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු මගින් ඉටුකර ගැනීම වෙනුවෙන් රු.8,026,275 ක් වැය කර තිබුණි. එසේම ලංසු ලියවිලිවල ඇතුළත් රසායනාගාර අයිතම යටතේ සවිකර තිබුණු උපකරණ 3 ක් අපේක්ෂිත ගුණත්වයෙන් නොතිබීම හේතුවෙන් නැවත එම උපකරණ වෙනත් සැපයුම්කරුවකුගෙන් මිලදී ගැනීම සඳහා රු.964,688 ක් වැය කිරීමට සිදු වී තිබුණි. | සැලසුම්කර ඉදිකිරීමේ ක්‍රමවේදය අනුව සිදුකරන ලද මෙම ව්‍යාපෘතියේ ඉටු නොකළ වැඩ සඳහා අමතරව දැරීමට සිදු වූ වටිනාකම හා අපේක්ෂිත ගුණත්වයෙන් නොතිබුණු උපකරණවල වටිනාකම කොන්ත්‍රාත්කරුගෙන් අයකළ යුතුය. | මෙම කොන්ත්‍රාත්තුවෙහි උපදේශන ආයතනය වෙතින් හා කොන්ත්‍රාත්කරු වෙතින් පැහැදිලි කිරීම් ලබා ගැනීමටත් එම තොරතුරු තාක්ෂණික කමිටු ඇගයීම සඳහා නැවත යොමු කිරීමටත් තීරණය කළ බව. | 2022 ජනවාරි 31 දින වන විටත් සිදුවී ඇති පාඩුව අදාළ පාර්ශව වෙතින් අයකිරීමට කටයුතු කර නොතිබුණි. |

**13.** **ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය**

| වර්ෂය | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| විගණන මතය | තත්වාගණනය කළ මතය | තත්වාගණනය කළ මතය | තත්වාගණනය කළ මතය |

| විගණන නිරීක්ෂණය/ ඌනතාවය | විගණකාධිපතිගේ නිර්දේශය | අස්ථිත්වයේ අදහස් දැක්වීම හා ගනු ලැබූ වැළැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| සම්පත් කළමනාකරණය පිළිබඳ තොරතුරු තාක්ෂණ පද්ධතිය (Enterprise Resource Planning) ස්ථාපනය කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා පිළියෙල කර තිබුණු ලංසු ලියකියවිලිවලට අනුව, ජයග්‍රාහී ලංසුකරුගේ මෘදුකාංග සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් අවසාන වර්ෂ තුනෙහි වාර්ෂික පිරිවැටුම රු.මිලියන 50 ක් ඉක්මවා තිබිය යුතු වුවද, එම අවශ්‍යතාවය සපුරා නොතිබුණු ලංසුකරුවෙකු ජයග්‍රාහී ලංසුකරු ලෙස තෝරා ගෙන තිබුණි. මුළු කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 8 ක් වූ කොන්ත්‍රාත්තුව, ගිවිසුම් ප්‍රකාරව 2018 මැයි 31 දින වන විට අවසන් කළ යුතු විය. නමුත් 2021 මාර්තු 31 දින වන විටත් රු.මිලියන 4 ක් පමණක් වැයකර තිබුණු අතර පද්ධතිය සම්පූර්ණ කර නොතිබුණි. | ලංසු කොන්දේසිවලට පටහැනිව ජයග්‍රාහී ලංසුකරු තෝරා ගැනීම සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතු අතර ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්තුව නිම කරවා ගැනීමටත් වත්කම් ඵලදායීව හා කාර්යක්ෂමව භාවිතයට ගැනීමටත් කටයුතු කළ යුතුය. | 2021 දෙසැම්බර් 31 දින වන විට පද්ධතියේ ඇති සියළුම දෝෂ හා අඩුපාඩු සම්පූර්ණ කර 2022 පළමු කාර්තුව තුළදී මෙම පද්ධතිය විශ්වවිද්‍යාල වෙත භාරදීමට කොන්ත්‍රාත්කරු එකඟවී ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් පද්ධතිය භාවිතයට ගත හැකි වන පරිදි සම්පූර්ණ කර නොතිබුණි. |

**14. ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය**

**--------------------------------**

| **වර්ෂය** | **2018** | **2019** | **2020** |
|---|---|---|---|
| **විගණන මතය** | **තත්වාගණනය කළ මතය** | **තත්වාගණනය කළ මතය** | **තත්වාගණනය කළ මතය** |

| | **විගණන නිරීක්ෂණය/ ඌනතාවය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **අස්ථිත්වයේ අදහස් දැක්වීම හා ගනු ලැබූ වැළැක්වීමේ පියවර** | **වර්තමාන තත්වය** |
|---|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3(1) වගන්තිය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2017 ජූලි 10 දිනැති අංක 10/2017 දරන චක්‍රලේඛය අනුව සියලුම කාර්යමණ්ඩලය තම පැමිණීම් හා පිටවීම් ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සටහන් කළ යුතු වුවත්, අධ්‍යයන කාර්ය මණ්ඩලය ඒ අනුව කටයුතු කර නොතිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 10/2017 චක්‍රලේඛය අනුව පැමිණීම් සහ පිටවීම් සලකුණු කිරීමට කටයුතු කළ යුතුය. | සාමාන්‍ය පුරුද්දක් ලෙස අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම සහ පිටවීම සටහන් නොකරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මෙම තත්ත්වය නිවැරදි කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේත්තුවෙන් පිරිවැය රු.483,321,635 ක් වූ දේපල පිරියත සහ උපකරණ 2019 වසර අවසන් වන විට සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් 2020 වසර අවසන් වන විට තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. | මූල්‍ය ප්‍රකාශනවල සඳහන් භාණ්ඩවල ඉතිරි කාණ්ඩය නැවත තක්සේරු කිරීමට කටයුතු කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් නැවත තක්සේරු කිරීමේ ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | උසස් අධ්‍යාපනය පුළුල් කිරීමේ හා සංවර්ධන කඩිනම් ව්‍යාපෘතිය (AHEAD) යටතේ 2018 වර්ෂයේදී ලබාගෙන තිබුණු පිරිවැය රු.23,055,912 ක්වූ iMac පරිගණක 44 ක් විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | පරිගණකවල පිරිවැය මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. | තොරතුරු ලබාගෙන සංඛ්‍යා ලේඛන පිළියල කිරීමට දැනටමත් කටයුතු කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් පරිගණකවල පිරිවැය ගිණුම්ගත කර නොතිබුණි. |
| (ඈ) | වර්ෂ 01 සිට වර්ෂ 19 දක්වා කාල සීමාවක් ගතවී තිබුණු එකතුව රු.9,719,273 ක් වූ ආපදා ණය, උත්සව අත්තිකාරම්, ලැබිය යුතු වැටුප්, බැඳුම්කර කඩ කිරීම්, කොන්ත්‍රාත්කරුවන්ගෙන් හා ආයතනවලින් ලැබිය යුතු ශේෂ 2020 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමකින් තොරව පැවතුණි. | ලැබිය යුතු හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | රු. 2,518,143 ක් අයකර ගැනීමට නඩු පවරා ඇති බව, රු. 6,173,532 ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලෙන් අඩු කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යවා ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් රු.9,276,315 ක් අයකර ගෙන නොතිබුණි. |
| (ඉ) | වර්ෂ 2 සිට වර්ෂ 7 දක්වා කාලයක සිට පැවති එකතුව රු. 12,834,860 ක් වූ සැපයුම්කරුවන්ට සහ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු රැඳවුම් මුදල් 2020 දෙසැම්බර් 31 දිනට නිරවුල් කර නොතිබුණි. | රැඳවුම් මුදල් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුයි. | 2021 වර්ෂයේ අවසාන ගිණුම් සැකසීමේදී රඳවා තබා ගැනීම් ගෙවීමට හෝ විශ්වවිද්‍යාල ආදායමට ගැනීමට කටයුතු කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් රැඳවුම් මුදල් නිරවුල් කර නොතිබුණි. |
| (ඊ) | මුදල් අමාත්‍යාංශයේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ විශ්වවිද්‍යාලයේ මුදල් කමිටුවේ එකඟතාවය සහ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2020 වර්ෂය තුළදී ස්ථාවර තැන්පතුවල රු.31,559,910 ක් ආයෝජනය කර තිබුණි. | උසස් අධ්‍යාපන ආයතනවල ආයතන සංග්‍රහයට අනුව කටයුතු කළ යුතුයි. | අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ මුදල් අමාත්‍යාංශයේ එකඟතාව ලබාගැනීමට කටයුතු කරමින් පවතින බව. | 2022 ජනවාරි 31 දින වන විටත් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ මුදල් අමාත්‍යාංශයේ එකඟතාව ලබාගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | වගකිවයුතු නිලධාරීන්ගේ නොසැලකිල්ල හේතුවෙන් කථිකාචාර්යවරයෙකුගෙන් අයවිය යුතු රු.මිලියන 1.73 ක බැඳුම්කර අයකර ගැනීම වෙනුවෙන් පියවර ගැනීමට වසර හයකට වැඩි කාලයක් ප්‍රමාදවීම හේතුවෙන් විශ්වවිද්‍යාලයට පාඩුවක් සිදුවී තිබුණි. නමුත් 2021 දෙසැම්බර් 31 දින වන විටත් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | බැඳුම්කර නියමිත වේලාවට නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. | නීතිමය මතය ලබා ගැනීම සඳහා යොමු කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මෙම බැඳුම්කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඌ) | 2017 සිට 2019 වර්ෂය දක්වා කාලය තුල ප්‍රසම්පාදනය කර තිබුණු පිරිවැය රු.මිලියන 93.5 ක් වූ රසායනාගාර උපකරණ වසර 1 සිට වසර 4 දක්වා කාලසීමාවක් තුළ ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි. | උපකරණ ඵලදායී ලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. | යාන්ත්‍රික ඉංජිනේරු උපාධි වැඩසටහන සඳහා බොහෝ උපකරණ තාවකාලික භාවිතයට ගෙන තිබුණු බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මෙම උපකරණ භාවිතයට ගෙන නොතිබුණි. |
| (එ) | කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 112 ක් වූ කළමනාකරණ හා වාණිජ පීඨයට ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් 2010 වර්ෂයේදී කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණු අතර එය 2014 පෙබරවාරි 28 දින හෝ ඊට පෙර අවසන් කළ යුතුව තිබුණි. 2014 අප්‍රේල් 20 වැනි දින ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණු නමුත්, ගිවිසුමට අනුව කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රමාද ගාස්තු ලෙස රු.2,977,412 ක් අයකරගෙන නොතිබුණු අතර රඳවාගැනීමේ මුදල් රු.2,808,880 ක් ප්‍රමාද ගාස්තුවලට හිලව් කර ගැනීමකින් තොරව වර්ෂ 06 කට වඩා වැඩි කාලයක සිට පැවත එමින් තිබුණි. | ප්‍රමාද ගාස්තු කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. | මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය සමඟ සාකච්ඡාවක් පවත්වන ලෙස කොන්ත්‍රාත්කරු ඉල්ලා සිටි බව හා Covid-19 තත්ත්වය හේතුවෙන් දිනය තහවුරු කර නොමැති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. |

**15.** **ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය**

---------------------------------

| වර්ෂය | 2018 | 2019 | 2020 |
| --- | --- | --- | --- |
| විගණන මතය | තත්වාගණනය කළ මතය | තත්වාගණනය කළ මතය | තත්වාගණනය නොකළ මතය |

| | විගණන නිරීක්ෂණය/ඌනතාවය | විගණකාධිපතිගේ නිර්දේශය | ආස්ථිත්වය විසින් ගනු ලැබූ වැලැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
| --- | --- | --- | --- | --- |
| (අ) | මාකඳුර වෛද්‍ය මධ්‍යස්ථානය සඳහා සුදුසු ගොඩනැගිල්ලක් ඉදිකිරීමකින් තොරව 2015 වර්ෂයේදී රු.680,041කට මිලදීගෙන තිබුණු වෛද්‍ය උපකරණ නිශ්කාර්යව පැවතුණි. | ප්‍රසම්පාදනයන් සිදු කිරීමේදී සැලසුම් සහගතව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී භාණ්ඩ ඇණවුම් කිරීමට ප්‍රථම ඒවායේ අවශ්‍යතාවය සහ ගබඩා කිරීමේ පහසුකම් පිළිබඳව සොයා බලා කටයුතු කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් වෛද්‍ය උපකරණ නිෂ්කාර්යව පැවතුණි. |
| (ආ) | The assessment of water and sediment quality and associated sea urchin of the gulf of manner coastline" ව්‍යාපෘතිය සඳහා එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය මගින් 2014 හා 2016 වර්ෂවල රු.3,437,160 ක් ලබාදී තිබුණද ඉන් රු.1,170,721 ක මුදලක් පමණක් වැයකර තිබුණි. 2020 දෙසැම්බර් 31 දින වන විටත් අදාළ ව්‍යාපෘතිය නිමකර නොතිබුණු අතර වර්ෂ 4 කට අධික කාලයක සිට රු.2,266,439 ක් උපයෝජනය කර නොතිබුණි. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණ ලඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. | එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය මගින් ව්‍යාපෘතියක් සඳහා ලබාදී තිබුණු ප්‍රතිපාදනයෙන් ඉතිරි මුදල සඳහා අදාළ ව්‍යාපෘති භාර ආචාර්යවරිය විසින් අයවැයක් පිළියෙල කර ඇති අතර ඒ සඳහා එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයෙහි අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව ඉදිරි මුදල් කමිටුව වෙත ඉදිරිපත් කිරීමට නියමිතය. | 2022 ජනවාරි 31 දින වන විටත් ව්‍යාපෘතිය නිමකර නොතිබුණි. |
| (ඇ) | වෛද්‍ය පීඨයේ නේවාසිකාගාර සංකීර්ණයට තොග විදුලි සැපයුම ලබාදීම සඳහා 2020 ජනවාරි 16 දින විදුලිබල මණ්ඩලය වෙත රු.4,293,155 ක් ගෙවා තිබුණද, වර්ෂය අවසාන වන විටත් එම කාර්ය නිම කර නොතිබුණි. | කාර්ය නිමකරවා ගෙන අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. | විදුලිබල මණ්ඩලය වෙත මුදල් ගෙවා ඇතත් අපේක්ෂා කළ පරිදි සමාලෝචිත වර්ෂය තුළදී මෙම කාර්යය නිම කිරීමට නොහැකි විය. | 2022 ජනවාරි 31 දින වන විටත් කාර්යය ඉටුකරවා ගැනීමට අපොහොසත්වී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | වැඩිදුර අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගතවී නියමිත කාලය තුළ ආපසු නොපැමිණි කථිකාචාර්යවරු දෙදෙනෙකුගෙන් 2011 වසරේ සිට අයවිය යුතු රු.3,172,714 ක් කඩිනමින් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | නීතිරීති ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මුදල් කඩිනමින් අයකර ගැනීම සඳහා මේ වන විට අවශ්‍ය නීති ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මුදල අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. |

**16. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය**

----------------------------------

| වර්ෂය | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| විගණන මතය | තත්වාගණනය නොකළ මතය | තත්වාගණනය නොකළ මතය | තත්වාගණනය නොකළ මතය |

| | විගණන නිරීක්ෂණ/ ඌනතාවය | විගණකාධිපතිගේ නිර්දේශය | අස්ථිත්වයේ අදහස් දැක්වීම හා ගනු ලැබූ වැළැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2018 නොවැම්බර් 08 දිනැති අංක HE/UD/09/DF/VPA/201 දරන උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය ප්‍රකාරව, විදේශ ගමන් සඳහා දේශීය අරමුදල් භාවිතා කිරීමට අනුමැතිය ලබාදී නොතිබියදී කෙටි කාලීන විදේශීය පුහුණු වැඩසටහන් 02 ක් සඳහා දේශීය අරමුදල් රු.9,293,409 ක් වැයකර නිලධාරීන් 19 දෙනෙකු විදේශීය පුහුණුව සඳහා යොමු කර තිබුණි. | විධිමත් අනුමැතියක් ලබාගැනීමෙන් පසු ගෙවීම් සිදුකළ යුතුය. | නිවාඩු හා ප්‍රදාන කමිටුවේ අනුමැතිය ලබාගෙන අදාළ පාඨමාලා ගාස්තු හා අනියම් දීමනා ගෙවීම විශ්වවිද්‍යාලය අනුගමනය කරන ක්‍රමවේදය වන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් විධිමත් අනුමැතියකින් තොරව විදේශීය පුහුණුව සඳහා දේශීය අරමුදල් භාවිතා කිරීමට ඉඩකඩ සලසාදී තිබුණු වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2016 වර්ෂයේදී නාට්‍ය, මුද්‍රා නාට්‍ය සහ නව නර්තන අධ්‍යනාංශයේ පැවති විෂය සමගාමී පරිගණක යෙදවුම් විෂය සඳහා වූ ප්‍රායෝගික පරීක්ෂණයට සහභාගී නොවූ ශිෂ්‍යාවකට පරීක්ෂණ මණ්ඩලය විසින් සහභාගී වූ ලෙස සඳහන් කර ලකුණු ලබාදී විභාග අක්‍රමිකතාවයක් සිදුකර තිබුණු අතර 2019 වර්ෂයේදී ඇයව ආධුනික කථිකාචාර්යවරියක ලෙස මෙම පීඨයටම බඳවාගෙන තිබුණි. | විභාග අක්‍රමිකතාවයන් පිළිබඳ විධිමත් ක්‍රියාමාර්ගයන් ගත යුතුය. | මූලික පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කර ඇති බව. | 2021 දෙසැම්බර් 31 දින වන විටත් මූලික විමර්ශනය අවසානවී තිබුණු නමුත් විමර්ශන වාර්තාව ලැබී නොතිබුණි. |

**17.** **ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය**

| වර්ෂය | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| විගණන මතය | තත්වාගණනය කළ මතය | තත්වාගණනය කළ මතය | තත්වාගණනය කළ මතය |

| | විගණන නිරීක්ෂණ/ ඌනතාවය | විගණකාධිපතිගේ නිර්දේශය | අස්ථිත්වයේ අදහස් දැක්වීම හා ගනු ලැබූ වැළැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2017 ජනවාරි 01 සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා කාලයට අදාළව විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ 390 දෙනෙකු වෙනුවෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය හා මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ලබා ගැනීමකින් තොරව ගෙවල් කුලී දීමනා ලෙස එකතුව රු.40,580,180 ක් අවිධිමත් ලෙස ගෙවා තිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය හා මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ලබා ගත යුතුය. | 2017 වර්ෂය දක්වාම විශ්වවිද්‍යාලය විසින් කුලියට ගත් නිවාස කාර්යමණ්ඩල නේවාසිකාගාර ලෙස භාවිතා කළ බව හා කාර්යමණ්ඩල සංඛ්‍යාව විශාලවීම නිසා එම නේවාසිකාගාර ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ගෙවල් කුලියක් ගෙවීමට සිදුවූ බව. | 2022 ජනවාරි 31 දින වන විටත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය හා මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ලබා ගැනීමට අපොහොසත්වී තිබුණු අතර තවදුරටත් ගෙවල් කුලී ගෙවමින් පවතී. |
| (ආ) | 2010 අප්‍රේල් 23 දිනැති හා අංක 921 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපති තනතුර සඳහා විවෘත බඳවා ගැනීමේදී, එම තනතුරට අදාළ සුදුසුකම් සපුරා නොතිබුණු අයදුම්කරුවකු 2018 ජූලි 25 දිනැති වැඩබලන උපකුලපතිවරයාගේ ලිපිය මගින් බඳවාගෙන 2018 අගෝස්තු සිට 2020 වර්ෂයේ ජූලි දක්වා කාලය සඳහා රු.5,418,552 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | තනතුරට අදාළ සියළු සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. | බඳවා ගැනීම සිදුකරන අවස්ථාවව වන විට දර්ශනපති උපාධිය සම්පූර්ණ කර තිබීම පදනම් කරගෙන ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපති තනතුරට බඳවා ගත් බව හා සුදුසුකම් සනාථ කර ගැනීම සඳහා අවශ්‍ය ලිපි අදාළ විශ්වවිද්‍යාල වෙත යොමු කළ බව. | 2022 ජනවාරි 31 දින වන විටත් සුදුසුකම් සනාථ කර ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයෙකුට චීනයේ සියාමන් විශ්වවිද්‍යාලයේ (Xiamen University) දර්ශනපති උපාධිය (Ph.D) හැදෑරීම සඳහා 2015 සැප්තැම්බර් 25 සිට 2018 සැප්තැම්බර් 24 දක්වා වසර 03 ක් සඳහා වැටුප් සහිත අධ්‍යයන නිවාඩුද වැටුප් සහිත අධ්‍යයන නිවාඩු අවසන් වන දින සිට 2019 ජූලි 24 දක්වා වැටුප් රහිත අධ්‍යයන නිවාඩුද අනුමත කර තිබුණි. නමුත් එම ආචාර්යවරයා දර්ශනපති උපාධිය සම්පූර්ණ නොකර 2019 ජූලි 11 දින සේවයට වාර්තා කර තිබුණි . 2021 ඔක්තෝබර් වන විට වසර 02 කට අධික කාලයක් දර්ශනපති උපාධිය සම්පූර්ණ කර නොතිබුණු අතර බැඳුම්කර ගිවිසුම් උල්ලංගනය කිරීම සම්බන්ධයෙන් විධිමත්ව කටයුතු කිරීමට අපොහොසත්වී තිබුණි. | නියමිත කාලය තුළ ආචාර්ය උපාධිය සම්පූර්ණ නොකළ බැඳුම්කර ගිවිසුම් කඩකල නිලධාරීන්ගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීමට නොපමාව පියවර ගත යුතුය. | ආචාර්ය උපාධිය නිම කිරීමේ සහතිකය භාරදීමට කල් ලබා දෙන ලෙස කර තිබුණු ඉල්ලීම සලකා බලා 2021 ජුනි 30 දින තෙක් කල් ලබාදීමට තීරණය කළ බව හා ඉන් පසුව බැඳුම්කර උල්ලංගනය කළ පුද්ගලයක් ලෙස සලකා කටයුතු කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් ආචාර්ය උපාධිය නිම කිරීමේ සහතිකය භාරදී නොතිබුණු නමුත් බැඳුම්කර වටිනාකම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

**18.** **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව**

| | | | |
|---|---|---|---|
| **වර්ෂය** | **2018** | **2019** | **2020** |
| **විගණන මතය** | **තත්වාගණනය කළ මතය** | **තත්වාගණනය කළ මතය** | **තත්වාගණනය කළ මතය** |

| | විගණන නිරීක්ෂණය/ඌනතාවය | විගණකාධිපතිගේ නිර්දේශය | අස්ථිත්වයේ අදහස් දැක්වීම හා ගනු ලැබූ වැළැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2011 ජනවාරි 25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, දේශීය විශ්වවිද්‍යාලවලට බඳවා ගැනීමට යෝජිත මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 0.5 කට සමාන විදේශ සිසුන් බඳවා ගත හැකිවේ. ඒ අනුව පසුගිය වර්ෂ 05 ක කාලය තුළදී බඳවා ගැනීමට යෝජිත මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් විදේශීය සිසුන් වෙනුවෙන් වෙන්කර තිබුණු සංඛ්‍යාව 220 ක් වුවද, බඳවා ගත හැකිව තිබුණු විදේශ සිසුන් සංඛ්‍යාව 58 ක් පමණක් විය. පුරප්පාඩු ලෙස පැවති විදේශීය සිසුන් 162 දෙනා වෙනුවට දේශීය සිසුන් බඳවා ගැනීම කෙරෙහි අවදානය යොමුකර නොතිබීම හේතුවෙන් විශ්ව විද්‍යාලවලට ඇතුළත්වීම අපේක්ෂාවෙන් සිටි දේශීය සිසුන් 162 දෙනෙකුට විශ්වවිද්‍යාල ප්‍රවේශය අහිමිවී තිබුණි. | විදේශ සිසුන් සඳහා වෙන් කර ඇති සියයට 0.5 සඳහා සිසුන් බඳවා ගැනීමෙන් පසු තවදුරටත් පවතින පුරප්පාඩු සඳහා දේශීය සිසුන්ට ඇතුළත්වීමට අවස්ථාව ලබා දිය යුතුය. | අයදුම් කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව අඩුවීම, අවම සුදුසුකම් සපුරා නොමැති සිසුන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවීම, කොළඹ නගරයෙන් පිටත පිහිටි විශ්වවිද්‍යාලවලට ප්‍රවේශය ලැබීමට විදේශීය සුදුසුකම්ලත් සිසුන් කැමැත්ත නොදැක්වීම යනාදී කරුණු මීට හේතුවූ බව. | 2019/2020 අධ්‍යයන වර්ෂයට අදාළ විදේශ සිසුන් සඳහා වෙන්කර තිබුණු ශිෂ්‍ය සංඛ්‍යාව 235 ක්ව තිබුණු නමුත් ඉන් 15 දෙනෙකු පමණක් බඳවා ගෙන තිබුණි. |
| (ආ) | දීප ව්‍යාප්ත මට්ටමින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයට පෙනී සිට ඉහළ Z අගයක් හිමිකර ගෙන ඇති අයදුම්කරුවන් විශ්වවිද්‍යාලයට ඇතුළත් කිරීම සඳහා පවත්වන යෝග්‍යතා පරීක්ෂණ අසමත්වීම හේතුවෙන් අ.පො.ස (උසස් පෙළ) විභාගයෙන් ඉහළ Z අගයකින් සමත් වුවද මනාපය පළ කරන ලද පාඨමාලාවලට ඇතුළත්වීමට හෝ විශ්වවිද්‍යාලයට පිවිසීමට තිබූ අවස්ථාව අහිමිවන තත්ත්වයක් නිරීක්ෂණය විය. මෙම ක්‍රමය සංශෝධනය කිරීම හෝ අත්හිටුවීමට කටයුතු නොකර 2019/2020 අධ්‍යයන වර්ෂයේදී ද විශ්වවිද්‍යාලයට සිසුන් ඇතුළත් කිරීමේදී යෝග්‍යතා පරීක්ෂණ | දීප ව්‍යාප්ත මට්ටමින් පවත්වනු ලබන තරඟකාරි විභාගයේ ප්‍රතිඵල මත විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු කළ යුතුය. | විවිධ පාර්ශවයන්ගේ දැඩි ඉල්ලීම මත එම පරීක්ෂණ තවත් වසර 02 කට පමණක් පැවැත්වීමට හා ඉදිරියේදී හඳුන්වා දෙනු ලබන නව පාඨමාලා සඳහා මෙම පරීක්ෂණ ඇතුළත් නොකිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තීරණය කළ බව. | 2021 දෙසැම්බර් 08 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ තීරණය පරිදි යෝග්‍යතා පරීක්ෂණ නොපැවැත්විය යුතු බවට තීරණය කර තිබුණද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2022 ජනවාරි 31 දින වන විටත් මේ සම්බන්ධයෙන් නිශ්චිත තීරණයක් |

| | | | | |
|---|---|---|---|---|
| | පැවැත්වීමේ ක්‍රියාවලිය අනුගමනය කර තිබුණි. | | | ගෙන නොතිබුණි. |
| (ඇ) | නවක වදය අවම කිරීම සඳහා පිහිටවූ Centre for Gender Equity and Equality අංශය සඳහා 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා රු.මිලියන 27 කට ආසන්න මුදලක් වැය කර තිබුණද එම කාලපරිච්ඡේදය තුළ වර්ෂයකට 200-250 ක් අතර ලැබී තිබුණු පැමිණිලි සංඛ්‍යාව අදාළ අංශ වෙත යොමු කර ක්‍රියාමාර්ග ගෙන ඇති බව අනාවරණය නොකෙරුණි. | අදාළ අරමුණු හා ඉලක්ක ලඟා කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. | විශ්වවිද්‍යාල අනධ්‍යාන සේවක වැඩ වර්ජනය හා යම් යම් අනෙකුත් ප්‍රයෝගික ගැටළු හමුවේ මෙම කේන්ද්‍රයෙහි ක්‍රියාකාරී සැලැස්මෙහි තිබුණු ක්‍රියාකාරකම් සම්බන්ධව සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව. | 2022 ජනවාරි 31 දින වන විටත් ලැබී තිබුණු පැමිණිලි විභාග කිරීමේ ප්‍රගතියක් නිරීක්ෂණය නොවීය. |
| (ඈ) | ශ්‍රී ලාංකික සිසුන්ගේ දක්ෂතා හා දැනුම වර්ධනය කිරීම සහ ඒ තුළින් නායකත්ව ගුණාංගවලින් පිරිපුන් සිසුන් බිහිකිරීමේ අරමුණින් 2010 වර්ෂයේ සිට 2020 වර්ෂයේ ජුනි දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් රු.මිලියන 452 ක මුදලක් දකුණු ආසියානු විශ්වවිද්‍යාලයේ සාමාජික ගාස්තු ලෙස කොමිෂන් සභාව විසින් වැයකර තිබුණද, ශ්‍රී ලාංකික සිසුන්ගේ දක්ෂතා හා දැනුම වර්ධනය කිරීම සහ ඒ තුළින් නායකත්ව ගුණාංගයන්ගෙන් පිරිපුන් සිසුන් බිහිකිරීමට දායකත්වයක් ලබා දී ඇති බව නිරීක්ෂණය නොවීය. | විදේශීය උසස් අධ්‍යාපන ආයතනයක් වෙත දිගු කාලයක සිට ගෙවමින් පවතින සාමාජික ගාස්තු වෙනුවෙන් ශ්‍රී ලාංකික සිසුන් වෙත ප්‍රතිලාභයක් සලසා ගැනීමට කටයුතු කළ යුතුය. | විදේශ කටයුතු අමාත්‍යාංශයේ දැනුම් දීම මත හා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය මත දකුණු ආසියානු විශ්වවිද්‍යාලය වෙත සාමාජික මුදල් ගෙවීම් කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් ශ්‍රී ලාංකික සිසුන් වෙත ප්‍රතිලාභයක් සලසා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

**19.** **ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද වෛද්‍ය විද්‍යායතනය**

| | | | |
|---|---|---|---|
| **වර්ෂය** | **2018** | **2019** | **2020** |
| **විගණන මතය** | **තත්වාගණනය කළ මතය** | **තත්වාගණනය කළ මතය** | **තත්වාගණනය කළ මතය** |

| **විගණන නිරීක්ෂණ/ ඌනතාවය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **අස්ථිත්වයේ අදහස් දැක්වීම හා ගනු ලැබූ වැළැක්වීමේ පියවර** | **වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|
| 2013 වර්ෂයේදී නිදහස් දීමනාවකින් පවරාදී තිබුණු හෙක්ටර්යාර් 2.3533 ක බිම් ප්‍රමාණයකින් යුත් වතුපිටිවල මාතලානේ පිහිටි ඖෂධ උද්‍යානයේ 2021 අප්‍රේල් 07 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී අදාළ වෘක්ෂලතා පහසුවෙන් වෙන්කර හඳුනාගැනීමට සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබීම, පවතින වෘක්ෂලතා පිළිබඳ සංගණනයක් සිදුකර නොතිබීම, වෘක්ෂලතා පිහිටීම දැක්වෙන වාර්තාකරණයක් නොමැතිවීම හා උද්‍යානය පවත්වාගෙන යන ආකාරය පිළිබඳ නිශ්චිත වැඩපිළිවෙලක් නොතිබීම යනාදී අඩුපාඩු නිරීක්ෂණය විය. | නිසි සැලසුමකින් හා කළමනාකරණයකින් යුක්තව ඖෂධ උද්‍යානයෙහි කටයුතු පවත්වාගෙන යා යුතුය. | පසුගිය කාල පරිච්ඡේදය තුළ ආයතනය තුළ වරින්වර සිදු වූ කළමනාකාරීත්ව වෙනස්කම් හේතුවෙන් උද්‍යානයෙහි සංවර්ධන කටයුතු සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමට යම් යම් දුෂ්කරතා මතුවූ බව. | 2021 දෙසැම්බර් දෙසැම්බර් 31 දින වන විටත් ඖෂධ උද්‍යානයෙහි කටයුතු නිසි සැලසුමකින් හා නිසි කළමනාකරණයකින් සිදුකිරීමට පියවර ගෙන නොතිබුණි. |

## 20. ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය

| වර්ෂය | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| විගණන මතය | තත්වාගණනය කළ මතය | තත්වාගණනය කළ මතය | තත්වාගණනය කළ මතය |

| විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | අස්ථිත්වයේ අදහස් දැක්වීම හා ගනු ලැබූ වැළැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| ආයතනය සඳහා කථිකාචාර්ය තනතුරක පුරප්පාඩුවක් පැවතියදී අධ්‍යයන පාඨමාලා පැවැත්වීම සඳහා බාහිර කථිකාචාර්යවරුන් 68 දෙනෙකුගේ සේවය ලබාගෙන ඒ සඳහා 2020 වර්ෂය තුළදී එකතුව රු.3,245,000ක් ගෙවා තිබුණි. | අනුමත පුරප්පාඩු සම්පූර්ණ කරගෙන බාහිර කථිකාචාර්යවරුන් වෙනුවෙන් ගෙවන දීමනා අවම කිරීමට කටයුතු කළ යුතුය. | පුරප්පාඩු වූ කථිකාචාර්ය ධුරය සඳහා අයදුම්පත් කැඳවූ නමුත් කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට නොහැකි වූ බව හා එම තනතුර සම්පූර්ණ කළද ආයතනය පවත්වනු ලබන සියලුම පාඨමාලා සඳහා ප්‍රමාණවත් නොවන බැවින් බාහිර සම්පත් දායකයින්ගේ සේවය ලබා ගන්නා බව. | 2022 ජනවාරි 31 දින වන විටත්, කථිකාචාර්යවරුන් ප්‍රමාණවත් නොවන බැවින් අනුමත කාර්යමණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 21. කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනය

| වර්ෂය | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| විගණන මතය | තත්වාගණනය නොකළ මතය | තත්වාගණනය නොකළ මතය | තත්වාගණනය කළ මතය |

| විගණන නිරීක්ෂණය/ඌනතාවය | විගණකාධිපතිගේ නිර්දේශය | අස්ථිත්වයේ අදහස් දැක්වීම හා ගනු ලැබූ වැළැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| (අ) ආපදා ණය ගෙවිය හැකි උපරිම සීමාව වූ රු.250,000 ඉක්මවා මූලික වැටුප මෙන් දස ගුණයක් ආපදා ණය ලෙස ගෙවා තිබීමෙන් නිලධාරීන් 44 දෙනෙකු වෙනුවෙන් එකතුව රු.11,364,433 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ආයතනයේ කළමණාකරණ මණ්ඩල අනුමැතියෙන් විශේෂ ආපදා ණය ක්‍රමයක් මීට වසර 10 කට පමණ පෙර සිටම ක්‍රියාත්මක කරන ලද බව, ඒ සඳහා අවශ්‍ය සම්පූර්ණ ප්‍රතිපාදන ආයතනය ඉපයූ අරමුදල්වලින් සම්පාදනය කර ගන්නා බව හා මෙම විශේෂ ආපදා ණය ගෙවීම සඳහා නිසි අනුමැතිය ලබා ගන්නා තෙක් තාවකාලිකව අත්හිටුවා ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මේ සම්බන්ධයෙන් විධිමත් අනුමැතියක් ලබා ගැනීමට අපොහොසත්වී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට බැඳුම්කර කඩකළ ආචාර්යවරුන් තිදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.6,569,834 ක් වර්ෂ 03 සිට වර්ෂ 16 දක්වා කාලපරිච්ඡේදයක් ඉකුත්වී තිබුණද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදුකළ යුතුය. | අයවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | 2021 දෙසැම්බර් 31 දින වන විටත් රු.4,331,995 ක් අයවිය යුතුව පැවතුණි. |

## 22. ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය

| | | | |
|---|---|---|---|
| **වර්ෂය** | **2018** | **2019** | **2020** |
| **විගණන මතය** | **තත්වාගණනය කළ මතය** | **තත්වාගණනය කළ මතය** | **තත්වාගණනය නොකළ මතය** |

| **විගණන නිරීක්ෂණය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **අස්ථිත්වයේ අදහස් දැක්වීම හා ගනු ලැබූ වැළැක්වීමේ පියවර** | **වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|
| ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 09 දෙනෙකුගේ පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමකින් තොරව එකතුව රු.19,224,085 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයට අනුව කටයුතු කළ යුතුය. | අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් අනුමත වැඩ නියමාවලින්ට සහ කාල සටහන්වලට අනුකූලව ආයතනයේ අධ්‍යක්ෂකගේ අධීක්ෂණය යටතේ රාජකාරි කටයුතු කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. |

## 23. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය

| වර්ෂය | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| විගණන මතය | තත්වාගණනය කළ මතය | තත්වාගණනය නොකළ මතය | තත්වාගණනය නොකළ මතය |

| විගණන නිරීක්ෂණය/ඌනතාවය | විගණකාධිපතිගේ නිර්දේශය | අස්ථිත්වයේ අදහස් දැක්වීම හා ගනු ලැබූ වැළැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| මධ්‍යස්ථානය විසින් 2005 වර්ෂයේ සිට 2014 වර්ෂය අතර කාලපරිච්ඡේදය තුළ පශ්චාද් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා ප්‍රදානලාභීන් 24 දෙනෙකු වෙත රු.42,338,669 ක ප්‍රදාන ලබාදී සමාලෝචිත වර්ෂය අවසන් වන විට වර්ෂ 07 සිට වර්ෂ 15 දක්වා කාලයක් ගතවී තිබුණද අදාළ ප්‍රදානලාභීන් විසින් පාඨමාලා සම්පූර්ණ කර නොතිබුණි. | ප්‍රදාන ලබාදීමෙන් පසු එම පාඨමාලා ආරම්භ කර හදාරන බවට මධ්‍යස්ථානය විසින් පසුවිපරම් කළ යුතුය. | විශේෂයෙන් අධ්‍යයන කටයුතු සම්පූර්ණ නොකරන ලද පැහැදිලි ප්‍රගතියක් දන්වා නොමැති ප්‍රදානලාභීන්ගෙන් මුදල් ලබා ගන්නා ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇති බව. | පාඨමාලා කටයුතු නතර කර ඇති ප්‍රදානලාභීන් වෙත ගෙවා ඇති මුදල් ආපසු ගෙවන ලෙස ලිපි යවා තිබුණු නමුත් 2022 ජනවාරි 31 දින වන විටත් මුදල් අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. |

## 24. ස්වාමි විපුලානාදන් සෞන්දර්ය අධ්‍යයන ආයතනය

| වර්ෂය | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| විගණන මතය | තත්වාගණනය කළ මතය | තත්වාගණනය කළ මතය | තත්වාගණනය කළ මතය |

| | විගණන නිරීක්ෂණය/ඌනතාවය | විගණකාධිපතිගේ නිර්දේශය | අස්ථිත්වයේ අදහස් දැක්වීම හා ගනු ලැබූ වැළැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2016 වර්ෂයේ සිට නියමිත වර්ෂවලදී පර්යේෂණ වාර්තා ඉදිරිපත් නොකල කාර්යමණ්ඩල සාමාජිකයින් 23 දෙනෙකු වෙනුවෙන් පර්යේෂණ දීමනා ලෙස රු. 3,885,993 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද එම ප්‍රතිපාදන පර්යේෂණ සඳහා භාවිතයට ගැනීමකින් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි. | අදාල අරමුණු සඳහා ප්‍රතිපාදන භාවිතා කිරීමට පියවර ගත යුතුය. | අතිරික්ත ප්‍රතිපාදන නැවත ගිණුම් පොත්වලට ගෙන ඒමට (write back) කටයුතු කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් ප්‍රතිපාදන උපයෝජනය කිරීමට හෝ පොත්වල ගැලපීම් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. |
| (ආ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් | චක්‍රලේඛයට අනුව | අනෙකුත් උසස් අධ්‍යාපන | 2022 ජනවාරි 31 දින |

| | | | | |
|---|---|---|---|---|
| | සභාව හා උසස් අධ්‍යාපන ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3(1) වගන්තිය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2017 ජූලි 10 දිනැති අංක 10/2017 දරන චක්‍රලේඛය අනුව සියලුම කාර්යමණ්ඩලය තම පැමිණීම් හා පිටවීම් ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සටහන් කළ යුතු වුවද අධ්‍යයන කාර්යමණ්ඩලය සිය පැමිණීම් හා පිටවීම් ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සටහන් තැබීම සිදුකර නොතිබුණි. | අවශ්‍ය පියවර ගත යුතුය. | ආයතනවල ක්‍රියාත්මක වන පරිදිම අධ්‍යයන කාර්යමණ්ඩලය ඔවුන්ගේ පැමිණීම් හා පිටවීම් ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සටහන් නොකරන බව. | වන විටත් මෙම තත්ත්වය නිවැරදි කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංග නොවන වත්කම්වල ඵලදායී ජීවි කාලය වාර්ෂිකව සමාලෝචනය ක නොතිබීම හේතුවෙන් පිරිවැ රු.17,259,976 ක් වූ දේපල පිරිය සහ උපකරණ 2019 දෙසැම්බර් 3 දින වන විට සම්පූර්ණයෙන් ක්ෂ කර තිබුණු නමුත් 2020 දෙසැම් 31 දින වන විට තවදුරට ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. අනුව ඇති වූ ඇස්තමේන්තුග දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අං ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකා නිවැරදි කිරීමට කටයුතු ක නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. | ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කිරීම සඳහා දක්ෂ පුහුණුලාභීන් තිදෙනෙකු යෙදවීමට කටයුතු කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | වර්ෂ 02 සිට වර්ෂ 08 දක්වා කාලයක සිට ලැබිය යුතු රු.2,950,935 ක් 2020 දෙසැම්බර් 31 දින දක්වාම අයකර ගෙන නොතිබුණි. | ලැබියයුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | අයකර නොතිබුණු බැඳුම්කර රු. 2,128,637 ක් කපා හැරීමට රාජ්‍ය මූල්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ හා ජාතික අයවැය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් ලැබිය මුදල් අයකර නොතිබුණි. |
| (ඉ) | 2020 වසර අවසන් වන විට | චක්‍රලේඛ අනුව | 2021 වර්ෂයේ සිට | 2022 ජනවාරි 31 දින |

| | | | | |
|---|---|---|---|---|
| | රු.6,166,845 ක පුස්තකාල පොත් පිළිබඳ ආයතනය ආරම්භ කළ දින සිට සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | පුස්තකාල පොත් පිළිබඳ සමීක්ෂණයක් ක්‍රියා කළ යුතුයි. | ඉදිරියට පුස්තකාල පොත් පිළිබඳ සමීක්ෂණ කටයුතු සිදු කරන බව. | වන විටත් පුස්තකාල පොත්වල සමීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි. |
| (ඊ) | විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2020 වසර අවසන් වන විට පැවති අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 13 ක් හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 44 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය. | ස්ථිර අධ්‍යයන තනතුරු 08 ක් බඳවා ගැනීමට දැන්වීම් පළ කර ඇති අතර ලැයිස්තුගත කිරීම් සිදු වෙමින් පවතින බව හා රජයේ උපදෙස් පරිදි අනධ්‍යයන තනතුරු සඳහා බඳවා ගැනීම් අත්හිටුවා ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මෙම තනතුරු පුරප්පාඩුව පැවතුණි. |
| (උ) | පිරිවැය රු.666,355,916 ක්වූ ස්ථාවර වත්කම්වලට අදාළව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කළ යුතුය. | ස්ථාවර වත්කම් ලේඛනය සහ දේපල, පිරියත සහ උපකරණ සම්බන්ධයෙන් සවිස්තරාත්මක උපලේඛන සකස් කරමින් පවතින බව. | 2022 ජනවාරි 31 දින වන විටත් ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කිරීම අවසන් කර නොතිබුණි. |

## 25. කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

-----------------------------------------------

| වර්ෂය | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| විගණන මතය | තත්වාගණනය කළ මතය | තත්වාගණනය නොකළ මතය | තත්වාගණනය නොකළ මතය |

| විගණන නිරීක්ෂණ/ ඌනතාවය | | විගණකාධිපතිගේ නිර්දේශය | අස්ථිත්වයේ අදහස් දැක්වීම හා ගනු ලැබූ වැළැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | පශ්චාත් උපාධි සම්පූර්ණ කරන ලද සිසුන් විසින් පර්යේෂණ කෘතීන් 125 ක් ආයතනය වෙත භාරදී තිබුණි. එකී කෘතීන් ජාතික හෝ ජාත්‍යන්තර පිළිගත් ප්‍රකාශන මඟින් ප්‍රසිද්ධ කිරීමට හෝ ඉන් තෝරාගත් කෘතීන් වාණිජකරණය කිරීමට හෝ නවෝත්පාදනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පිළිගත් ක්‍රමවේදයන් අනුගමනය කරමින් ආයතනයේ හෝ රටේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පර්යේෂණ කෘති ජාතික හෝ ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධ කිරීමට හෝ වාණිජකරණය හෝ නවෝත්පාදනයතුළින් රටේ අභිවෘද්ධිය සඳහා යොදා ගත යුතුය. | ආයතනය විසින් පවත්වන වාර්ෂික මහ සමුළුව වෙත සිය පර්යේෂණ කෘති ඉදිරිපත් කිරීමට සිසුන් වෙත අවස්ථාව ලබාදී ඇති බව හා එහිදී ඇගයීමට ලක් වන එම පර්යේෂණ කෘති ප්‍රකාශනයට පත්කිරීමට කටයුතු කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් පර්යේෂණ කෘතීන් ප්‍රසිද්ධ කිරීමට, වාණිජකරණය කිරීමට හා නවෝත්පාදනය කිරීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. |
| (ආ) | ගිණුම්කරණ පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීම වෙනුවෙන් පෞද්ගලික සමාගමක් සමඟ රු.2,100,000 ක මුදලකට ගිවිසුම්ගතවී 2017 වර්ෂයේදී අත්තිකාරම් වශයෙන් රු.1,500,000 ක් ගෙවා තිබුණු නමුත්, ගිවිසුම්ගත කාල පරිච්ඡේදය අවසන්වී වර්ෂ 03 කට වැඩි කාලයක් ගතවී තිබුණද පරිගණක පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි. | ගිවිසුම්ගත කටයුතු මනා අධීක්ෂණයක් හා පාලනයක් යටතේ නියමිත කාලය තුළ අවසන් කර ගැනීමට කටයුතු කළ යුතුය. | ගිවිසුම් කාලය දීර්ඝ කර ගැනීමට කටයුතු කළ බව. | ගිවිසුම් කාලය 2020 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණු නමුත් 2022 ජනවාරි 31 දින වන විටත් පරිගණක පද්ධතිය ස්ථාපිත කිරීමේ කාර්යය අවසන් කර නොතිබුණි. |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දින වන විට ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු රු.11,160,670 ක්ද පාඨමාලා ගාස්තු රු.17,432,712 ක්ද වර්ෂ 03 සිට වර්ෂ 10 දක්වා කාලයක් අය විය යුතුව පැවතුණි. | නියමිත කාල සීමාව තුළ ලැබිය යුතු සියලු ආදායම් අය කර ගත යුතුය. | විවිධ ක්‍රමවේදයන් අනුගමනය කරමින් නියමිත කාල සීමාව තුළ ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු අය කර ගැනීමට කටයුතු කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් රු.15,864,063 ක් අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. |
| (ඈ) | 2020 වර්ෂය තුළ නිම කිරීමට අපේක්ෂිත රු.31,107,047 ක් වටිනා ඉදිකිරීම් ව්‍යාපෘතීන් 04 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | අපේක්ෂිත කාල සීමාව තුළ සියලු ඉදිකිරීම් කටයුතු නිම කළ යුතුය. | අපේක්ෂිත කාල සීමාව තුළ සියලු ඉදිකිරීම් කටයුතු නිම කිරීමට පියවර ගන්නා බව. | 2022 ජනවාරි 31 දින වන විටත් ව්‍යාපෘති 04 ම ක්‍රියාත්මක කර නොතිබුණි. |

## 26. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

-------------------------------------------

| වර්ෂය | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| විගණන මතය | තත්වාගණනය නොකළ මතය | තත්වාගණනය කළ මතය | තත්වාගණනය කළ මතය |

| විගණන නිරීක්ෂණය/ඌනතාවය | විගණකාධිපතිගේ නිර්දේශය | අස්ථිත්වයේ අදහස් දැක්වීම හා ගනු ලැබූ වැළැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| PGIM Research & Publication අරමුදලේ 2018 වර්ෂයේ සිට පවතින රු.3,605,803 ක්, ස්ථාවර වත්කම් පුනරුත්ථාපනය සහ පුස්තකාල පොත් හා වාර්තා ප්‍රකාශන සඳහා 2018 හා 2019 වර්ෂයන්හි ලැබී තිබුණු එකතුව රු.1,625,666 ක් අදාළ කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබුණි. | අරමුණුගත කාර්යයන් හඳුනාගෙන සැලසුම්ගතව වැය කිරීමට කටයුතු කළ යුතුය. | අරමුණු ගත කාර්යයන් කිසිවක් පසුගිය වසර දෙක තුළ ක්‍රියාත්මක නොවූ බව හා ඉතිරිව තිබෙන අරමුදල් 2021 වර්ෂයේදී අදාළ වියදම් සඳහා යෙදවීමට කටයුතු කරන බව. | 2021 දෙසැම්බර් 31 දින වන විටත් PGIM Research & Publication අරමුදල සම්පූර්ණයෙන්ම හා ස්ථාවර වත්කම් පුනරුත්ථාපන අරමුදලේ රු.1,024,995ක් උපයෝජනය කර නොතිබුණි. |

**27. පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය**

-------------------------------------------------------

| වර්ෂය | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| විගණන මතය | තත්වාගණනය කළ මතය | තත්වාගණනය කළ මතය | තත්වාගණනය කළ මතය |

| විගණන නිරීක්ෂණ/ ඌනතාවය | විගණකාධිපතිගේ නිර්දේශය | අස්ථිත්වයේ අදහස් දැක්වීම හා ගනු ලැබූ වැළැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| කැලණිය මානෙල්ගම පරිශ්‍රයේ ඉදිකෙරෙන ආයතනයේ නව ගොඩනැගිල්ලේ මංගල ශිලා ස්ථාපනය වෙනුවෙන් 2019 වර්ෂය තුළදී විවිධ වියදම් සඳහා රු.3,598,493 ක් වැයකර තිබුණු අතර අවම පිරිවැයක් යටතේ උත්සව කටයුතු සංවිධානය කිරීම සඳහා කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි. ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු2019 මැයි 14 දින ආරම්භ කර 2021 මැයි 13 දින නිම කළ යුතු නමුත් ගොඩනැගිල්ලේ සැලසුම විගණිත දිනය වූ 2020 අගෝස්තු 14 දිනය දක්වාම අනුමත කර නොතිබුණි. | පිරිවැය අවම වන පරිදි කටයුතු කිරීමට කළමනාකරණයේ අවධානය යොමු විය යුතුය. | මංගල ශිලා ස්ථාපනය සඳහා රු.3,598,493 ක් වැයකළ බව. | 2021 දෙසැම්බර් 31 දින වන විටත් ගොඩනැගිල් ලේ සැලසුම අනුමත කර ගැනීමට හෝ වැඩ නිම කරවා ගැනීමට අපොහොසත්වී තිබුණි. |

**28. කළමනාකරණ පශ්වාද් උපාධි ආයතනය**

-------------------------------------------

| වර්ෂය | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| විගණන මතය | තත්වාගණනය කළ මතය | තත්වාගණනය කළ මතය | තත්වාගණනය කළ මතය |

| | විගණන නිරීක්ෂණය/ඌනතාවය | විගණකාධිපතිගේ නිර්දේශය | අස්ථිත්වයේ අදහස් දැක්වීම හා ගනු ලැබූ වැළැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | වර්ෂ 3 කට අධික කාලයක සිට පාඨමාලා 3 කට අදාළව පැවත එන එකතුව රු.1,527,144 ක් වූ ලැබිය යුතු පාඨමාලා ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ පාඨමාලා ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | නියමිත ගාස්තු ගෙවා නොමැති සිසුන්ට අදාළ පරීක්ෂණවලට පෙනී සිටීමට අවසර ලබා නොදීමට ඉදිරියේදී පියවර ගනු ලබන බව. | 2021 දෙසැම්බර් 31 දින වන විටද ලැබිය යුතු පාඨමාලා ගාස්තු අයකර නොතිබුණි. |
| (ආ) | ඩුබායි ශාඛාවේ රු.මිලියන 58.2 ක වංචාව සම්බන්ධයෙන් 2009 වර්ෂයේදී පැවති පොදු ව්‍යාපාර කමිටු වාර්තාව මගින් සිදු කරන ලද නිර්දේශ ප්‍රකාරව විමර්ශනය සඳහා 2011 වර්ෂයේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පවරා තිබුණද වංචාව සිදුවී වසර 10 ක් ගතවී ඇතත් නඩු පැවරීමක් හෝ සිදුවී නොතිබුණි. | අදාළ විමර්ශන කටයුතු කඩිනමින් සිදුකර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. | ඩුබායි ශාඛාවේ මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට නීතිපති උපදෙස් ලැබෙන තෙක් නඩු පැවරීම ප්‍රමාදවී ඇති බව. | 2021 දෙසැම්බර් 31 දින වන විටත් නඩු පැවරීමක් සිදුකර නොතිබුණි. |
| (ඇ) | ඩුබායි ශාඛාවෙන් ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ වශයෙන් පිළිවෙලින් රු.2,079,000 ක් හා රු.11,603,217 ක් දීර්ඝ කාලයක් තිස්සේ විමර්ශනය කිරීමකින් තොරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරියට ගෙන එමින් පැවතුණි. | වසර 10 කටත් අධික කාලයක් ගතවී ඇති මෙම ශේෂ නිරවුල් කිරීමට කඩිනම් පියවර ගත යුතුය. | ඩුබායි ශාඛාවේ කටයුතු පිළිබඳ අපරාධ පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් පවත්වන විමර්ශනය අවසන් වූ පසු මේ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බව. | 2021 දෙසැම්බර් 31 දින වන විටත් අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව විසින් පවත්වන පරීක්ෂණය අවසන් කර නොතිබුණි. |
| (ඈ) | 2012 වර්ෂයේ විශ්‍රාම ගන්වා තිබුණු ආයතනයේ හිටපු අධ්‍යක්ෂකවරයාගෙන් අයවිය යුතු රු.2,874,482 ක්වූ ණය මුදල් අයකර ගැනීමට 2020 වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි. | විශ්‍රාම ගැනීමට පෙර ආයතනය වෙත අයවිය යුතු මුදල් අයකර ගත යුතුය. | අධ්‍යක්ෂකවරයාගේ අර්ථසාධක අරමුදල නිදහස් කරන විට ණය මුදල අයකර ගැනීමට කටයුතු කරන බව. | 2021 දෙසැම්බර් 31 දින වන විටත් ණය මුදල අයකර ගෙන නොතිබුණි. |

## 29. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය

-------------------------------------

| වර්ෂය | 2018 | 2019 | 2020 |
| --- | --- | --- | --- |
| විගණන මතය | තත්වාගණනය නොකළ මතය | තත්වාගණනය නොකළ මතය | තත්වාගණනය නොකළ මතය |

| විගණන නිරීක්ෂණ/ ඌනතාවය | විගණකාධිපතිගේ නිර්දේශය | අස්ථිත්වයේ අදහස් දැක්වීම හා ගනු ලැබූ වැළැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
| --- | --- | --- | --- |
| අනුමත කාර්ය මණ්ඩලයෙන් බැහැරව කළමනාකරණ මණ්ඩලයේ තීරණ මත පර්යේෂණ සඳහා දායක කර ගැනීම සඳහා පර්යේෂණ සහකරුවන් 05 දෙනෙකු 2011 වර්ෂයේ සිට බඳවාගෙන තිබුණි. මේ හේතුවෙන් ආයතනයේ පාඨමාලා හදාරන විද්‍යාර්ථයින්ට ආයතනයේ පළපුරුදු ආචාර්යවරයෙකු යටතේ පර්යේෂණ සහකරුවෙකු ලෙස පර්යේෂණ වලට සහභාගී වීමට ඇති ඉඩ ප්‍රස්ථාව ඇහිරී තිබුණි. | විද්‍යාර්ථයින්ට පලපුරුදු ආචාර්යවරුන් යටතේ පර්යේෂණ සහකරුවෙකු ලෙස සහභාගි වීමට ඉඩ ප්‍රස්ථාව සැලසිය යුතුය. | කළමනාකරණ මණ්ඩලයේ නිර්දේශ අනුව කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව. | 2021 දෙසැම්බර් 31 දින වන විටත් පර්යේෂණ සහකරුවන් 04 දෙනෙකු තවදුරටත් සේවයේ යොදවා තිබුණි. |

**30. විද්‍යා පශ්චාත් උපාධි ආයතනය**

---------------------------------

| වර්ෂය | 2018 | 2019 | 2020 |
| --- | --- | --- | --- |
| විගණන මතය | තත්වාගණනය කළ මතය | තත්වාගණනය කළ මතය | තත්වාගණනය කළ මතය |

| විගණන නිරීක්ෂණ/ ඌනතාවය | විගණකාධිපතිගේ නිර්දේශය | අස්ථිත්වයේ අදහස් දැක්වීම හා ගනු ලැබූ වැළැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
| --- | --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු.53,946,827 ක් වූ ජංගම නොවන වත්කම් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. | වත්කම්වලින් කොටසක ප්‍රත්‍යාගණන කටයුතු අවසන් කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් ප්‍රත්‍යාගණන කටයුතු අවසන් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ | ගිණුම්කරණ ප්‍රමිතවලට | සම්පූර්ණයෙන් ක්ෂය | 2022 ජනවාරි 31 |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රමිත 07 හි 47 ඡේදය ප්‍රකාරව 2010 සහ 2011 වර්ෂවලදී ප්‍රත්‍යාගණනය කරන ලද රු.15,116,057 ක් වටිනා වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය වී තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය තුළදී එම වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි. | අනුකූලව කටයුතු කළ යුතුය. | කර ඇති වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කිරීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව. | දින වන විටත් ප්‍රත්‍යාගණන කටයුතු අවසන් කර නොතිබුණි. |
| (ඇ) | 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන තිබුණු ලැබිය යුතු පාඨමාලා ගාස්තු රු.15,428,800 කින් 2018 වර්ෂය තුළ කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණි. | හිඟ පාඨමාලා ගාස්තු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | පාඨමාලා සඳහා ලියාපදිංචි වීමේදී පාඨමාලා ගාස්තුවෙන් සියයට 30 ක්ද, දෙවන සමාසිකයේදී සියයට 33 ක්ද අවසාන විභාගයට පෙර ඉතිරි සම්පූර්ණ මුදලද අයකරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් හිඟ පාඨමාලා ගාස්තු වලින් රු.4,979,393 ක් අයකර ගෙන නොතිබුණි. |
| (ඈ) | 2017 දෙසැම්බර් 31 දින සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා Short Course, Workshop & Other සඳහා ගෙවිය යුතු ශේෂ 15 ක එකතුව රු.2,117,843 ක් 2020 වර්ෂය තුළදීද නිරවුල්කර නොතිබුණි. | ගෙවිය යුතු වියදම් කඩිනමින් ගෙවා නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | කෙටිකාලීන වැඩමුළු වලට අදාල බාහිර දේශකවරුන්ට හා අනෙකුත් ගෙවීම් කිරීමට අදාල දින නියමයන් පිළිබඳ සීමාවන් පනවා ඇති බව හා පාඨමාලා අවසන්වී වර්ෂයකින් පසු ගෙවීම් නොකිරීමට තීරණය කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් පාඨමාලා 04 කට අදාළ රු.1,385,280 ක ශේෂ නිරවුල් කර නොතිබුණි. |
| (ඉ) | ආයතනය විසින් මහජන බැංකුව පේරාදෙණිය ශාඛාවේ ආරම්භ කර තිබුණු ස්ථාවර තැන්පතු 14 ක් 2009 ජනවාරි 01 දින සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ අවලංගු කර ලබාගත් රු. 93,287,025 ක මුදලින්, රු.37,948,865 ක් නව ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ඉතිරි රු.55,338,160 න් රු.5,000,000 ක් මාස 6 ක පමණ කාලයක් අයථා ලෙස පරිහරණය කර ආයතනය පවත්වාගෙන යන බැංකු ගිණුමේ තැන්පත් කර තිබුණි. එම මුදලින් ඉතිරි රු.50,338,160 ක් ආයතනයට අයත් බැංකු ගිණුමට තැන්පත් නොකර මුදල් පොත්වලද | වංචා කරන ලද මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම මුදල අයකර ගැනීම සඳහා මහනුවර දිසා අධිකරණයේ අංක B/43167/17 යටතේ නඩු පවරා ඇත. | 2022 ජනවාරි 31 දින වන විටත් නඩුව අවසන්වී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සටහන් නොකර ජොෂ්ඨ සහකාර මූල්‍ය අධිකාරි විසින් වංචනිකව ලබාගෙන තිබුණි. | | | |
| (ඊ) | ආයතනයේ පර්යේෂණ හා ශිෂ්‍යත්ව පහසුකම් ලබාදීම සඳහා 2018 වර්ෂයේදී ආරම්භ කර තිබුණු අරමුදලෙන් මේ දක්වාම කිසිදු ශිෂ්‍යත්ව හෝ පර්යේෂණ කටයුත්තක් සඳහා මුදල් වැයකර නොතිබුණු අතර 2020 වර්ෂය අවසන් වන විට එම අරමුදලේ ශේෂය රු.7,771,002 ක් විය. | අරමුදල් ලැබී ඇති කාර්යයන් සඳහා කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ යුතුය. | විගණනය විසින් පෙන්වා දී ඇති විද්‍යා පශ්චාත් උපාධි පර්යේෂණ අරමුදලේ ශේෂයෙන් උපයෝජනය කරගනිමින් පර්යේෂණ ව්‍යාපෘති 12ක් සඳහා රුපියල් මිලියන 6 ක පර්යේෂණ ප්‍රදානයන් 2021 වර්ෂය තුළදී ලබා දී ඇති බව. | 2021 දෙසැම්බර් 31 දින වන විටත් රු.2,083,789 ක් උපයෝජනය කර නොතිබුණි. |
| (උ) | පර්යේෂණ කටයුතු සඳහා ලබාදී තිබුණු රු.2,353,608 ක් වූ පර්යේෂණ අරමුදල් 08 ක් 2020 වර්ෂය තුළ උපයෝජනය කර නොතිබුණි. | අරමුදල් ලැබී ඇති කාර්යයන් සඳහා කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය. | පර්යේෂණ අරමුදල් උපරිම වශයෙන් උපයෝජනය කිරීමට කටයුතු කරන බව. | 2021 දෙසැම්බර් 31 දින වන විටත් උපයෝජනය නොකළ මුදල රු.996,839 ක් විය. |

**31. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය**

| වර්ෂය | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| විගණන මතය | තත්වාගණනය කළ මතය | තත්වාගණනය කළ මතය | තත්වාගණනය කළ මතය |

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | අස්ථිත්වයේ අදහස් දැක්වීම හා ගනු ලැබූ වැළැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශිෂ්‍ය ගාස්තු (Receivables from Students) ආදායම රු.4,306,380 ක් වූ අතර ඒ තුළ වර්ෂ 03 ට වැඩි ශේෂය රු.2,003,100ක් විය. එම මුදල් අයකර ගැනීමට විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. | ඒ ඒ වර්ෂයේදී ලැබිය යුතු ලෙස හඳුනා ගන්නා ශේෂයන් කාලීනව අයකර ගැනීමට ක්‍රමවේදයන් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. | ලැබිය යුතු ශිෂ්‍ය ආදායම් කාණ්ඩයට අයත්වන දැනට ක්‍රියාකාරී මට්ටමේ නොසිටින ශිෂ්‍යයන් සංඛ්‍යාව තහවුරු කරගැනීමේ කටයුතු සිදුකරමින් පවතින බව හා දැනට ක්‍රියාකාරී මට්ටමේ සිටින මුදල් නොගෙවා ඇති සිසුන්ගෙන් මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | 2021 දෙසැම්බර් 31 දින වන විටත් අයකර නොතිබුණු ශේෂය රු.4,199,130 ක් විය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනය සඳහා වූ ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2017 ජූලි 10 දිනැති අංක 10/2017 දරන චක්‍රලේඛය අනුව සියලුම කාර්යමණ්ඩලය තම පැමිණීම් හා පිටවීම් ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සටහන් කළ යුතු වුවද, ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම එපරිදි තහවුරු කර ගැනීමකින් තොරව 2018 වර්ෂයේ වැටුප් හා දීමනා ලෙස රු.12,273,298 ක් ගෙවා තිබුණි. | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයට අනුකූලව කටයුතු කළ යුතුය. | අධ්‍යයන කාර්යමණ්ඩලයේ කාර්යභාරය නිශ්චිත කාල රාමුවකට සීමා කළ නොහැකි නිසා පැමිණීම සහ පිටවීම ශ්‍රී ලංකාවේ කිසිදු විශ්වවිද්‍යාලයක සටහන් නොකරන බව හා මේ පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයද දැනුවත්ව ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි පැමිණීම හා පිටවීම සනාථ කරගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2019 දෙසැම්බර් 31 දිනට සංවර්ධන අරමුදලේ පැවති (PGIE Development Fund) රු.3,967,500 ක ශේෂය වසර 05 ක කාලයක සිට අදාළ අරමුණු වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි. | අරමුදල් ස්ථාපිත කර ඇති අරමුණු වෙනුවෙන් උපයෝජනය කළ යුතුය. | 2020 ඔක්තෝබර් 16 දින පැවැති කළමනාකරණ මණ්ඩල තීරණයට අනුව සංවර්ධන අරමුදලේ මුදල් ආයතනයේ භාවිතය සඳහා නිර්මාණය කරනු ලබන කළමනාකරණ තොරතුරු පද්ධතිය වෙනුවෙන් උපයෝජනය කිරීමට වෙන්කර ඇති බව. | 2021 දෙසැම්බර් 31 දින වන විටත් මෙම අරමුදල් උපයෝජනය කර නොතිබුණි. |

**32.** මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

| වර්ෂය | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| විගණන මතය | තත්වාගණනය නොකළ මතය | තත්වාගණනය නොකළ මතය | තත්වාගණනය නොකළ මතය |

| | විගණන නිරීක්ෂණ/ ඌනතාවය | විගණකාධිපතිගේ නිර්දේශය | අස්ථිත්වයේ අදහස් දැක්වීම හා ගනු ලැබූ වැළැක්වීමේ පියවර | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | පාඨමාලා ගාස්තු එක් එක් පාඨමාලාවේ අවසන් විභාග පරීක්ෂණයට කලින් අයකර ගත යුතු වුවත්, 2018 වර්ෂයේ පාඨමාලා 07 කට අදාළව ලැබිය යුතු පාඨමාලා ගාස්තු ලෙස දක්වා තිබුණු රු.39,665,822 ක මුදල තුළ පාඨමාලා අවසන්වී වර්ෂ 01 ත් වර්ෂ 03 ත් දක්වා කාල පරාසයක පැවති වටිනාකම රු.19,984,027 ක් වී තිබුණි. | ලැබිය යුතු ආදායම් අදාළ කාලපරිච්ඡේදය තුළ නොපමාව අය කර ගැනීමට කටයුතු කළ යුතුය. | නියමිත කාලය තුළ පාඨමාලා ගාස්තු ගෙවා නොමැති සිසුන්ට විභාගය සඳහා සහභාගීවීම වැළැක්වීමට අවශ්‍ය කටයුතු යොදා ඇති බව. | 2021 දෙසැම්බර් 31 දින වන විටත් හිඟ පාඨමාලා ගාස්තු අයකර ගෙන නොතිබුණි. |
| (ආ) | මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් දැනට පවත්වාගෙන යනු ලබන පාඨමාලාවලින් පාඨමාලා 51 ක් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය කඩිනමින් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | අලුතින් ආරම්භ කරන ලද සියළු පාඨමාලාවන් සඳහා අදාළ අනුමැතීන් ඒ ඒ අවස්ථාවේදීම ගනු ලබන බව. | අදාළ අනුමැතීන් ලබාගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කර තිබුණු නමුත්, 2022 ජනවාරි 31 දින වන විටත් අනුමැතිය ලබා ගැනීමට අපොහොසත්වී තිබුණි. |
| (ඇ) | ආයතනයේ පිවිසුම් මාර්ගය පුළුල් කිරීම හා වාහන ගරාජයක් ඉදිකිරීම සඳහා වූ රු.4,666,843 ක මුදලකට ගිවිසුම්ගත වූ කොන්ත්‍රාත්තුව 2019 මැයි 27 වන දින වන විට අවසන් කිරීමට නියමිතව පැවතුණද 2020 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. | ඉදිකිරීම් කොන්ත්‍රාත් ගිවිසගත් කාල පරිච්ඡේදය තුළ නිම කිරීමට කටයුතු කළ යුතුය. | ආයතනයේ අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත් බව. | 2022 ජනවාරි 31 දින වන විටත් ඉදිකිරීම් කටයුතු නිමකරවා ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | Minan Buddhist Collage China ආයතනයෙන් ප්‍රදාන වශයෙන් 2017, 2018 හා 2019 වර්ෂවලදී විදේශීය සිසුන් සඳහා නවාතැන් පහසුකම් සංකීර්ණයක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීම වෙනුවෙන් ලැබී තිබුණු රු.6,699,195 ක් 2020 දෙසැම්බර් 31 දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි. | අරමුදල් කඩිනමින් උපයෝජනය කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. | ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා අදාළ අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කරමින් සිටින බව. | 2022 ජනවාරි 31 දින වන විටත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. |
| (ඉ) | ආයතනයේ ගොඩනැගිල්ල නවීකරණය කිරීම සඳහා 2018 වර්ෂයේ වෙන් කරන ලද මුදලින් රු.1,170,025 ක් 2019 දෙසැම්බර් 31 දින වන විටත් උපයෝජනය කර නොතිබුණි. | අරමුදල් ලැබී ඇති කාර්යය සඳහා කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය. | ආයතනයේ අවශ්‍යතා නිසි පරිදි හඳුනාගෙන ප්‍රසම්පාදනයන් සැලසුම් කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදුන් බව. | 2022 ජනවාරි 31 දින වන විටත් එම මුදල උපයෝජනය කර නොතිබුණි. |
| (ඊ) | අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා කොන්ත්‍රාත් පදනම මත 16 දෙනෙකු බඳවාගෙන 2020 වර්ෂය තුළදී රු.6,067,134 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණු නමුත් අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කාර්යය මණ්ඩලය අනුමත සීමාව තුළ පවත්වාගෙන යා යුතුය. | කාර්යය මණ්ඩලය වැඩි කිරීම සඳහා විශ්වවිද්‍යාල කොමිෂන් සභාව වෙත ඉල්ලීම් කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |